
ISSN 1391-4006

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2011




**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
(අධ්‍යාපන අමාත්‍යාංශය)

**தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை**
(கல்வி அமைச்சு)

**NATIONAL LIBRARY AND DOCUMENTATION SERVICES BOARD**
**(Ministry of Education)**

අංක. 14
නිදහස් මාවත
කොළඹ 07

இல. 14
சுதந்திர வழி
கொழும்பு 07

No.14
Independence Avenue
Colombo 07

අධ්‍යාපන අමාත්‍යාංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# වාර්ෂික වාර්තාව
# 2011

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
# වාර්ෂික වාර්තාව - 2011

(1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාර සැකසුණි)

**අරමුණු හා ආයතනික දර්ශනය**

ජනතාවගේ දැනුම වර්ධනය කිරීම රටක සංවර්ධන ක්‍රියාවලියේ අතිශයින් වැදගත් කාර්යයකි. සමාජයේ විවිධ ජන කොටස්වලට අවශ්‍ය දැනුම විද්‍යාත්මක ව හා ක්‍රමානුකූල ව ලබාදීමට අවස්ථාව සලසාදීම රටක පුස්තකාල පද්ධතියෙහි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලද අතර 1998 අංක 51 දරන පනත මගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නමින් එහි කටයුතු වඩාත් පුළුල් කෙරිණි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යෑම
(ආ) ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම වේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය වන අතර එය දිවයිනේ අනෙකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙස කටයුතු කරයි. එමෙන් ම ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු යටතේ පුස්තකාල සඳහා උපදේශක සේවා ලබා දීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු පැවැත්වීම, පුස්තකාල සම්පත් ලබා දීම, පොත් ප්‍රදර්ශන පැවැත්වීම, කියවීමේ රුචිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පුස්තකාල ශ්‍රේණිගත කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම, විවිධ ව්‍යසනවලින් හානි වූ පුස්තකාල සංවර්ධනය, පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම, පුස්තකාල සහයෝගිතා වැඩසටහන් සංවිධානය හා ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ආධාර කිරීම වැනි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරේ.

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 3 වැනි වගන්තිය (ආ) ප්‍රකාර ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය 2011.12.31 දින වන විට පහත සඳහන් පරිදි විය.

01. මහාචාර්ය සෝමරත්න බාලසූරිය මහතා - (සභාපති)

**සාමාජිකයන් - නිල බලයෙන්**

02. පී.බී.අබේකෝන් මහතා (ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය)
03. එම් එස් යූ අමරසිරි මහතා (සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය)
04. මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මිය (සභාපති, ජාතික විද්‍යා පදනම)
05. එච් එම් ගුණසේකර මහතා (ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)
06. විමල් රුබසිංහ මහතා (ලේකම්, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය)
07. සී. පෙරේරා මෙනවිය - රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව
08. මහාචාර්ය ජී.ඩබ්. ඇපාසිංහ මහතා (සභාපති, ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාව

**අනෙකුත් සාමාජිකයින්**

09. ආචාර්ය ලීල් ගුණසේකර මහතා
10. ආචාර්ය කේ.ඩී.ජී.විමලරත්න මහතා

11. මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා
12. එච් ඩී ප්‍රේමසිරි මහතා
13. මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතා

2010 මැයි මාසයෙන් පසු මණ්ඩලයේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල් මණ්ඩලයීය සේවයෙන් ඉවත් වීමත් සමඟ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය ද 2010 දෙසැම්බර් මස දක්වා පත්කර නො මැත. නැවත ඉහත සඳහන් සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන ලද්දේ 2011.09.01 දින සිට ය.

2011 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 04 ක් පවත්වන ලදි.

**උපදේශක කමිටු**

ආයතනයේ ඒ ඒ අංශවල කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සඳහා පත් කරන ලද උපදේශක කමිටු මේ වසර තුළ දී සාර්ථක ව ක්‍රියාත්මක විය. පහත සඳහන් පරිදි එම කමිටු හා අනු කමිටු රැස්වීම් පවත්වා ඇත.

(1) එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් හා ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියක් සැකසීමේ කමිටුව (ප්‍රතිග්‍රහණ අංශය) රැස්වීම් වාර 01
(2) ප්‍රකාශන උපදේශක කමිටුව (ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය) - රැස්වීම් වාර 04
(3) මුද්‍රණ උපදේශක කමිටුව (ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය) - රැස්වීම් වාර 02
(4) පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ උපදේශක කමිටුව ( ව්‍යාප්ති සේවා අංශය) - රැස්වීම් වාර 01
(5) විගණන හා කළමනාකරණ කමිටුව (පරිපාලන අංශය) - රැස්වීම් වාර 01
(6) ICH ක්‍රියාකාරී රැස්වීම් 02 ක් හා අනු කමිටු රැස්වීම් 07 ක් පැවැත්වීම.

**සේවයෙන් විශ්‍රාම යාම්**

| **නම** | **තනතුර** | **දිනය** |
|---|---|---|
| ජී.එච්.අයිරාංගනී මිය | ලිපිකරු ලේඛිකා | (2011.01.22) |
| ඩී.ඒ.ධර්මසේන මහතා | පුස්තකාල සහකාර I | (2011.03.09) |
| පී.වී.මුණිදාස මහතා | පුස්තකාල සහායක | (2011.03.31) |

**ඉල්ලා අස්වීම්**

| | | |
|---|---|---|
| එම් යූ අයි පෙරේරා මිය | පුස්තකාල සහකාර II | (2011.01.31) |
| පී ජී සිරිසේන මහතා | පුස්තකාල සහයක | (2011.03.28) |
| කේ කොටුවේගෙදර මහතා | පරිගණක වැඩසටහන් සම්පාදක | (2011.05.03) |
| පුෂ්පා චාන්දනී මිය | පුස්තකාල සහායක | (2011.05.12) |
| ඒ එස් හේවගේ මහතා | අධ්‍යක්ෂ ජනරාල් | (2011.05.31) |
| ඒ වී එම් කේ අංකුඹුර මෙය | සහකාර පුස්තකාලයාධිපති | (2011.08.01) |
| සීතා ගම්ලත් මිය | පුස්තකාල සහකාර II | (2011.10.17) |
| ඕ ඩී හපුආරච්චි මෙනවිය | පුස්තකාල සහකාර III | (2011.12.02) |
| ලතිකා ප්‍රියංගනී මිය | පුස්තකාල සහකාර III | (2011.12.14) |

2011.12.31.දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

| තනතුර | සේවයේ යෙදී සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | | 01 |
| අධ්‍යක්ෂ (මුදල් හා පාලන) | - | 01 |
| අධ්‍යක්ෂ (වෘත්තීය) | 02 | - |
| සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්) | | 01 |
| සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ(පාලන | 01 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෘත්තීය) | 01 | 02 |
| සහකාර අධ්‍යක්ෂ | 01 | 08 |
| ජාල කළමනාකරු | - | 01 |
| අභ්‍යන්තර විගණක | 01 | - |
| ලේඛන සංරක්ෂක | - | 01 |
| ප්‍රකාශන නිලධාරි | 01 | - |
| පුද්ගලික සහකාර | - | 01 |
| පරිපාලන නිලධාරි | - | 01 |
| පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරි | 07 | 02 |
| සංරක්ෂණ නිලධාරි | 01 | - |
| පර්යේෂණ නිලධාරි | - | 01 |
| ව්‍යාප්ති නිලධාරි | - | 01 |
| අලෙවි ප්‍රවර්ධන නිලධාරි | - | 01 |
| පුහුණු කිරීමේ නිලධාරි | - | 01 |
| පද්ධති විශ්ලේෂක | 01 | - |
| නඩත්තු නිලධාරි | 01 | - |
| මූල්‍ය නිලධාරි | 01 | - |
| මූල්‍ය සහකාර | 01 | - |
| පුස්තකාල සංවර්ධන සහකාර | 07 | 05 |
| තොරතුරු තාක්ෂණ සහකාර | - | 01 |
| තොරතුරු සහකාර | 34 | 16 |
| ලේඛන ප්‍රතිසංස්කාරක | - | 02 |
| කළමනාකරණ සහකාර (තා.නො.) | 25 | 11 |
| රියදුරු | 06 | - |
| විදුලි කාර්මික | 01 | - |
| පොත් බැඳුම්කරු | 03 | 03 |
| පුස්තකාල සහායක | 07 | 06 |
| කාර්යාල සහායක | 21 | 08 |
| එකතුව | 123 | 75 |

**කාර්ය මණ්ඩල පුහුණුවීම්**

**දේශීය පුහුණුවීම් හා සම්මන්ත්‍රණ**

01. ලලිත් ඇතුළත්මුදලි ජාතික තරුණ සේවා මධ්‍යස්ථානය මගින් පැවැත් වූ වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2011 - කේ.එන්.සමන්ති මෙනවිය - පුස්තකාල සංවර්ධන සහකාර

02. **Business English Accredited by Edexcel (Intermediate)** පාඨමාලාව සඳහා මණ්ඩලයීය නිලධාරීන් 10 දෙනෙක් සහභාගී වූහ.

03. අභ්‍යන්තර විගණනයේ ඵලදායිතා පිළිබඳ සම්මන්ත්‍රණය 2011.08.20 දින වෘත්තීය නිපුණතා අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන ආයතනය, එම් අයි චිත්‍රා පද්මිණී මිය - අභ්‍යන්තර විගණක

04. පරිපාලන නීති හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය 2011.09.06 **ICTAD** ආයතනය, ඩී.ආර්. ජයසිංහ මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)

05. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ හා පොත් බැඳුම්කරණය පිළිබඳ තෙදින පුහුණු වැඩමුළුව - 2011.11.28 දින ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නිලධාරීන් 14 ක් සහභාගී වූහ.

06. ලේඛන කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව 2011.11.24- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පැවති අතර නිලධාරීන් 45 දෙනෙක් සහභාගී වූහ.

07. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් සංවිධානය කළ NACLIS-2011 සම්මන්ත්‍රණය 2011.06.28 දින ඒ සඳහා ඩබ්ලිව් සුනිල් මහතා, සේනානි බණ්ඩාර මිය, වරුණි ගහබඩආරච්චි මිය හා චන්දිමා වාදසිංහ මෙය යන නිලධාරීන් 04 දෙනෙක් සහභාගී වූහ.

**08.** තොරතුරු තාක්ෂණ හැකියාව වර්ධනය කිරීමේ එක්දින වැඩමුළුව - ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ජී ඩබ්ලිව් ලක්ෂ්මී මිය, කේ ජී සුධර්මා මිය හා කේ ඒ නිල්මිණී මිය යන 05 දෙනා සහභාගී වූහ.

**විදේශීය පුහුණුවීම්**

(1) 2011.04.02 - 2011.06.30 දක්වා දකුණු කොරියාවේ පැවති සංරක්ෂණ විද්‍යාව පිළිබඳ ආසියානු සහයෝගිතා වැඩසටහන සඳහා සංරක්ෂණ නිලධාරී එල්.එම්. උදය ප්‍රසාද් කබරාල් මහතා සහභාගී විය.

(2) ආසියානු සාගර කලාපීය ජාතික පුස්තකාල අධ්‍යක්ෂ වරුන්ගේ වාර්ෂික සම්මන්ත්‍රණය (CDNL - AO ) 2011.04.16- 19 දක්වා ද. කොරියාවේ දී පැවති අතර ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල් ඒ එස් හේවගේ මහතා සහභාගී විය.

(3) ISBN/ ISMN වර්ෂික සම්මන්ත්‍රණය 2011.09.13-17 දක්වා ද. අප්‍රිකාවේ දී පැවති අතර ඒ සඳහා ප්‍රකාශන නිලධාරී ශ්‍රීමා සූරියබණ්ඩාර මිය සහභාගී වූවා ය.

(4) ආසියා හා ශාන්තිකර කලාපයේ අස්පර්ශීය උරුමයන් පිළිබඳ ජාල විශේෂඥයින්ගේ අන්තර්ජාතික සමුළුව 2011.11.28 සිට 2011.12.03 දක්වා ද. කොරියාවේ දී පැවති අතර ඒ සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්ලිව් සුනිල් මහතා සහභාගී විය.

**ප්‍රතිග්‍රහණ අංශය**

ප්‍රතිග්‍රහණ අංශයේ වගකීම හා කාර්යභාරය වනුයේ ජාතික පුස්තකාලයට සුදුසු පොත්පත් සහ වෙනත් වර්ගවල පුස්තකාල ද්‍රව්‍ය අත්පත් කර ගැනීමයි. ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියට අනුව (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන ප්‍රකාශන, (ii) ශ්‍රී ලංකාව පිළිබඳ විදේශ රටවල පළවන ප්‍රකාශන, (iii) ශ්‍රී ලාංකිකයන් විසින් විදේශ රටවල පළ කරන ප්‍රකාශන (iv) ප්‍රධාන විමර්ශන ග්‍රන්ථ (v) වෙනත් පුස්තකාලවලට ලබාගත නො හැකි එහෙත් පර්යේෂණ සඳහා

අත්‍යවශ්‍ය විමර්ශන ග්‍රන්ථ සහ (vi) පුස්තකාල හා විද්‍යාපන විද්‍යා ක්ෂේත්‍රයට අයත් ප්‍රකාශන ලබාගැනීම කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ. මීට අමතර ව ISBN, ISSN හා ISMN අංක ලබාදෙන ප්‍රකාශන තැන්පතු පිටපත් සේ ලබාගැනෙයි. (i) වර්ගයට අයත් ප්‍රකාශන හා පුස්තකාල හා විද්‍යාපන විද්‍යා ක්ෂේත්‍රයට අයත් ප්‍රකාශන එකකින් පිටපත් 02 බැගින් ද, (ii) හා (iii) වර්ගයට අයත් ප්‍රකාශන පිටපත් 02 බැගින් ද, විමර්ශන ග්‍රන්ථවලින් එක් පිටපතක් බැගින් ද ලබාගැනීමට කටයුතු කෙරේ. විමර්ශන ග්‍රන්ථ ලබාගැනීමේ දී ඒවායේ නව සංස්කරණ කාලානුරූප ව මිලට ගැනෙයි.

### නීත්‍යානුකූල තැන්පතු ක්‍රමය

1885 මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥා පනතේ 1976 වසරේ සංශෝධනය අනුව ශ්‍රී ලංකාවේ පළවන සැම ප්‍රකාශනයක ම පිටපතක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුවට නීත්‍යානුකූල ව හිමි වේ. මෙම නීතිය ක්‍රියාත්මක කරන ආයතනය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වේ. මුද්‍රණකරුවන් හා ප්‍රකාශකයන් විසින් එහි තැන්පත් කරනු ලබන පිටපත්වලින් එක් පිටපතක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට ලබා දෙයි. මෙම වසර තුළ දී නීත්‍යානුකූල තැන්පතු ක්‍රමය යටතේ පොත් සහ වෙනත් ප්‍රකාශන 8709 ක් ද, පුවත්පත් 12337 ක් ද ජාතික පුස්තකාලයට ලැබී ඇත.

### ජාත්‍යන්තර පොත් හුවමාරු සේවය

විවිධ විදේශීය රටවල ජාතික පුස්තකාල හා අනෙකුත් ප්‍රධාන පුස්තකාල සමඟ හුවමාරු සම්බන්ධතා ගොඩනගා ගැනීම මඟින් ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම ජාතික පුස්තකාල එකතුව වර්ධනය වීමට හේතු වේ. 2011 වසරේ ජාත්‍යන්තර පොත් හුවමාරු වැඩ පිළිවෙළ යටතේ පොත් මිල දී ගැනීම සඳහා වැය වී ඇති මුදල දළ වශයෙන් රු.1912.00 ක් වේ.

### මිල දී ගැනීම්

මිල දී ගැනීම්, ජාතික පුස්තකාලයට අවශ්‍ය ප්‍රකාශන අත්කර ගන්නා ප්‍රධාන මාර්ගයකි. දේශීය ප්‍රකාශන අතරින් නීති ම ය තැන්පතු ක්‍රමය යටතට නො වැටෙන ප්‍රකාශන, තැන්පතු ක්‍රමයට අයත් එහෙත් තැන්පත් නො වන ප්‍රකාශන සහ තැන්පතු ක්‍රමය යටතේ ලැබෙන ප්‍රකාශනවල අමතර පිටපත් මිල දී ගනු ලබයි. එසේ ම විදේශීය ප්‍රකාශන හා මූලික විමර්ශන ග්‍රන්ථ මිල දී ගැනීමේ දී දේශීය හා විදේශීය ග්‍රන්ථ නාමාවලි, පොත් ලැයිස්තු, පුවත්පත්, වාර සඟරා, අන්තර්ජාලය වැනි විවිධ මූලාශ්‍ර උපයෝගී කර ගනී. (මිල දී ගැනීම් යටතේ 2011 වර්ෂය තුළ දී ජාතික පුස්තකාලය සඳහා පොත් සහ වෙනත් පුස්තකාල තොරතුරු මූලාශ්‍ර මිල දී ගැනීමට වැය කළ මුදල දළ වශයෙන් රු.3,442,065.00 කි.)

මෙම වර්ෂය තුළ දී පොත් 3786 ක් ද, පශ්චාත් උපාධි නිබන්ධ 16 ක් ද, දේශීය වාර සඟරා දායකත්ව අලුත් කිරීම් 09ක් ද විදේශීය වාර සඟරා දායකත්ව අලුත් කිරීම් 07ක් හා ඉලෙක්ට්‍රොනික මූලාශ්‍ර දායකත්වය අලුත් කිරීම් 02 ක් ලෙස ජාතික පුස්තකාලය සඳහා අත් කර ගැනීමට කටයුතු කර ඇත.

### පරිත්‍යාග

ජාතික පුස්තකාල එකතුව වර්ධනය කර ගැනීම පිණිස පුද්ගලයන් සහ විවිධ ආයතනවලින් ලැබෙන පරිත්‍යාග බෙහෙවින් ඉවහල් වේ. පරිත්‍යාග වශයෙන් 2011 වසරේ දී දේශීය හා විදේශීය වශයෙන් ප්‍රකාශන 2089 ක් ලැබී ඇත. ඒ අනුව දේශීය ප්‍රකාශන 1916 ක් හා විදේශීය ප්‍රකාශන 173ක් ලැබී ඇත.

**ආයතනික සාමාජිකත්වය අලුත් කිරීම**

අන්තර් පුස්තකාල සංගම් සංවිධානය (IFLA), සාමාජිකත්වය අලුත් කර ඇති අතර ඒ සඳහා රු.64,000.00 ක් ගෙවා තිබේ. එසේ ම ජාතික භූගෝලවිද්‍යා සංගමය, CILIP ආයතනය හා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය යන දේශීය සංගම්වල සාමාජිකත්වය අලුත් කර ඇති අතර ඒ සඳහා රු. 88,400.00 ක් ගෙවන ලදී.

## පාඨක සේවා අංශය

ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති පොත්පත් සහ අනෙකුත් පුස්තකාල තොරතුරු මූලාශ්‍ර පරිශීලනය කිරීමට පාඨකයින්ට අවස්ථාව සලසා දීම මෙම අංශයේ මූලික කාර්යභාරය වේ. පසුගිය වසර කිහිපය සමඟ සසඳන විට 2011 වසරේ ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය මඟින් වැඩි පාඨක පිරිසකට සේවය සපයා ඇත. මෙම වසර තුළ ජාතික පුස්තකාල එකතුව පරිහරණය කරන ලද්දේ ප්‍රධාන වශයෙන් ම උසස් අධ්‍යාපන ආයතන ඇතුළු වෙනත් පර්යේෂණ ආයතනවලට සම්බන්ධ පර්යේෂකයින්, පශ්චාත් උපාධි හා උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයින් ඇතුළු විවිධ තරාතිරම්වල අය වියිනි. ඔවුන්ගේ අවශ්‍යතා සඳහා මහල් තුනක ප්‍රධාන කියවීම් ශාලා තුනක් ද, විශේෂ තොරතුරු මේසයක් ද (Information Desk) පාඨක සේවා අංශය තුළ පවත්වාගෙන යනු ලැබේ. මීට අමතර ව බිම් මහලේ විමර්ශන එකතුව පුළුල් කිරීමත් අන්තර්ජාල සේවා පුළුල් කිරීම සඳහා අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක 03ක් සවි කිරීමත් මගින් පාඨකයින් සඳහා පහසුකම් සලසා තිබේ.

**විමර්ශන හා තොරතුරු සැපයීමේ සේවය**

මෙම වසර තුළ ජාතික පුස්තකාලයේ විවිධ එකතු මඟින් පාඨකයින් සඳහා විමර්ශන හා තොරතුරු සේවාවන් සපයා ඇත. වැඩි වශයෙන් පරිහරණය කරනු ලබන එකතු වශයෙන් පුවත්පත් එකතුව, වාර සඟරා එකතුව, රජයේ ප්‍රකාශන එකතුව, නීත්‍යනුකූල තැන්පතු එකතුව වැනි එකතු හැඳින්විය හැකි ය. 2011 වර්ෂය තුළ පාඨකයන් 593 ක් ස්ථිර සාමාජිකත්වය ද පාඨකයන් 9227 ක් කෙටිකාලීන සාමාජිකත්වය ද ලබාගෙන තිබේ. සාමාජිකත්වය අලුත් කර ඇති සංඛ්‍යාව 88 කි. ශ්‍රී ලාංකික නො වන සාමාජික සංඛ්‍යාව 10 කි. කියවීමේ මාසයේ නොමිලේ සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව 1800 කි. ඒ අනුව 2011.12.31 වන විට සම්පූර්ණ ස්ථිර පාඨක සංඛ්‍යාව 11399 කි. අදාළ වසර තුළ පාඨකයින් 18,180 ක් ජාතික පුස්තකාලය භාවිත කර ඇත.

**ඡායා පිටපත් සේවය**

ජාතික පුස්තකාලයේ විවිධ එකතුවල අන්තර්ගත පුස්තකාල තොරතුරු මූලාශ්‍රයන් හි ඡායා පිටපත් පාඨකයන්ට ලබාගැනීමට පහසුකම් සලසා ඇත. මෙම වසර තුළ පාඨකයින් 9358 දෙනෙකුට ඡායා පිටපත් 97,444 ක් ලබාදෙන ලදී. ඒ සඳහා රු. 638,178.00 ක ආදායමක් ලැබී ඇත.

**විමසීම් සේවය**

විවිධ විෂයයන් සම්බන්ධයෙන් තොරතුරු විමසා පුද්ගලයන්ගෙන් ලැබෙන විමසීම්වලට පිළිතුරු සැපයීම ද මෙම අංශය ඉටු කරන තවත් සේවාවකි. මේ යටතේ ලිපි මඟින්, විද්‍යුත් තැපැල් මගින්, දුරකථන මගින් හා පැමිණ කළ විමසීම් 1966 කට පිළිතුරු සපයා ඇත.

**පුස්තකාල ද්‍රව්‍යන්හි සංරක්ෂණ හා ආරක්ෂණ කටයුතු**

දෛනික ව වායු සමීකරණ යන්ත්‍ර මගින් උෂ්ණත්වය සහ ආර්ද්‍රතා පාලනමාන මගින් ආර්ද්‍රතාව

පාලනය කෙරේ. මෙයට අමතර ව පොත් 418 ක්, වීඩියෝ පට 18 ක් හා සිතියමක් සංරක්ෂණ කටයුතු සඳහා භාර දී ඇත.

**අන්තර්ජාල හා බහු මාධ්‍ය සේවා**

වඩාත් පුළුල් ලෙස තොරතුරු සැපයීමේ අරමුණින් පාඨකයන් වෙත අන්තර්ජාල සේවාව හඳුන්වා දී ඇති අතර මෙම වසර තුළ පාඨකයන් විශාල ප්‍රමාණයකට මේ මගින් සේවා සපයා ඇත. ඒ අනුව 2011 වසරේ පාඨකයින් 167 දෙනෙකු පැය 181 විනාඩි 50 ක් තොරතුරු ගවේෂණය සඳහා අන්තර්ජාලය භාවිත කර තිබේ.මෙයට අමතර ව පාඨකයින් 23 ක් පැය 33 විනාඩි 25 ක් Library and Information Science Abstract (LISA) හා පාඨකයින් 14 ක් පැය 17 විනාඩි 25 ක් විද්‍යා උපහැරණ අනුක්‍රමණිකාව (Science Citation Index) ගවේෂණය කර ඇත.

**පුවත්පත් කැපුම් එකතුව**

විවිධ විෂය මාතෘකා 130 ක් යටතේ පුවත්පත් ලිපි 1300 ක් එකතුවට ඇතුළත් කොට තිබේ.

**අන්තර් පුස්තකාල පිරුළු සේවාව**

පුස්තකාල පොත්, පිරුළු ක්‍රමය ආරම්භ කළේ 1990 වර්ෂයේ දී ය. මෙම වසර තුළ ද ප්‍රධාන පුස්තකාල ගණනාවක් සමඟ මෙම සේවය පවත්වාගෙන යනු ලැබිණි. ඒ අනුව 2011 වසරේ ආයතන 15ක් සඳහා ග්‍රන්ථ 19 ක් ලබා දී ඇත.

**ජාතික පුස්තකාලයේ මිතුරෝ සංවිධානය**

ජාතික පුස්තකාලයේ උන්නතිය සඳහා ආරම්භ කරන ලද ජාතික පුස්තකාලයේ මිතුරෝ (Friends of National Library) සංවිධානයේ කමිටු රැස්වීම් 04 ක් මෙම වසර තුළ පවත්වා ඇති අතර දෙවන සංවත්සරික උත්සවය 2011.09.05 දින පැවැත්වී ය.

## තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පරිගණක සේවා සහ තොරතුරු තාක්ෂණය යොදා ගැනීමට අදාළ කටයුතුවල මෙන් ම මෙම ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ උපදේශක සේවා සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම වසර තුළ අංශයේ කටයුතු වඩාත් පුළුල් ව ක්‍රියාත්මක කර තිබේ.

**ජාතික පුස්තකාල නිවහන් පිටුව**
මේ යටතේ www.natlib.lk නිවහන් පිටුවේ අදාළ යාවත්කාලීන කිරීම් සිදුකර ඇත

**ජාතික පුස්තකාල පරිගණක සුවිය**

**Alice for Windows නව මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාම**

Alice for Windows මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාම හා ගැටළු නිරාකරණය කිරීම. මේ සඳහා වන වාර්ෂික නඩත්තු ගිවිසුම Soft link Asia Pvt.Ltd ආයතනය සමඟ අත්සන් කර තිබේ.

**ජාතික පුස්තකාලයේ වෙබ් සේවා (web server) හා මේල් සේවා (mail server) පවත්වාගෙන යාම.**

ආයතනයේ Web server හා Mail server සේවා පවත්වාගෙන යාම, නඩත්තු කිරීම හා ගැටලු නිරාකරණය කිරීම.

**පරිගණක වැඩසටහන් සම්පාදන කටයුතු**

මේ යටතේ පහත සඳහන් වැඩසටහන් සකස් කරන ලදී.

- ❖ ප්‍රකාශනගත සුචිකරණ දත්ත (CIP) හා ISBN ලබාදීම සඳහා වැඩසටහන් සැකසීම.
- ❖ ජන සාහිත්‍යය කෘති එකතුව සංඛ්‍යාංකකරණය (digitize) කිරීම සඳහා වැඩසටහනක් සැකසීම.
- ❖ ජනශ්‍රැතිය පිළිබඳ ග්‍රන්ථ නාමාවලි සඳහා දත්ත පදනම් සැකසීම.
- ❖ Cash Register එකක් මිල දී ගැනීමට හා ස්වයංක්‍රියකරණ පද්ධතියක් නිර්දේශ කිරීම හා වාර්තාවක් ලබාදීම.

**Pothgula ILS මෘදුකාංගය භාවිත කිරීම**

මෙය පාසැල්වල භාවිත කිරීමේ දී ඇතිවන ගැටලු සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් පුස්තකාල අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කර අදාළ නිර්දේශ ලබා දුනි. එසේ ම මෙම මෘදුකාංගය භාවිත කරන පාසැල්වල Barcod Labels මුද්‍රණයට අවශ්‍ය මුද්‍රණ යන්ත්‍ර නො මැති පාසැල් සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

**පරිගණක අධ්‍යාපන හා පුහුණු කටයුතු**

අධ්‍යාපන හා පුහුණු අංශය මගින් පවත්වන පුහුණු වැඩසටහන්වල දී තොරතුරු තාක්ෂණ කටයුතුවලට අදාළ සහාය ලබා දී ඇත. ඒ අනුව පරිගණක හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුස්තකාලයාධිපතීන් දැනුවත් කිරීම සඳහා දේශන පැවැත්වීමෙන් සහාය වී තිබේ. මීට අමතර ව මොනරාගල, බුත්තල පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී අන්තර් ජාල ගවේෂණ කටයුතු හා ඒවා ලබාගැනීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන ගොස් තිබේ.

**ආයතනයේ සියලු ම අංශවල පරිගණක කටයුතු අධීක්ෂණය කිරීම**

නව පරිගණක 10 ක් හා UPS යන්ත්‍රයක් මිල දී ගැනීම, හා අදාළ අංශවලට බෙදා දීම.

## ග්‍රන්ථ විඥාපන පාලන අංශය

ග්‍රන්ථ විඥාපන පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරය ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීමයි. මෙම අංශය මගින් ප්‍රවර්තන ජාතික ග්‍රන්ථ නාමාවලිය, පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය හා විශේෂ ග්‍රන්ථ නාමාවලි වර්ග කිහිපයක් සම්පාදනය කරනු ලබයි.

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය - 2011**

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම ජාතික පුස්තකාලය සතු ප්‍රධාන වගකීමකි. ජාතික

ග්‍රන්ථ නාමාවලිය යනු රට තුළ පළවන සියලු ම ප්‍රකාශනවල තොරතුරු ඇතුළත් සාධිකාර ප්‍රකාශනයකි. මෙම කාර්යය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 1974 වර්ෂයේ සිට ඉටු කරනු ලබයි. 1962 සිට 1973 දක්වා මෙම කාර්යය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2010 සැප්තැම්බර් කලාපයේ සිට 2011 ඔක්තෝබර් දක්වා මාසික ව නිකුත් කිරීම සාර්ථක ව ඉටු කළ අතර කලාප 14 ක සම්පාදන කටයුතු නිම කරන ලදී. මෙයට අමතර ව අදාළ කලාප සඳහා ලැබුණු සියලු ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ග්‍රන්ථ වර්ග කිරීම, සුචිගත කිරීම, සුචි පත්‍රිකා යතුරු ලියනය, සංස්කරණය, සාධිකාරී ගොනුව සම්පාදනය හා අත්පිටපත් යතුරු ලියනය යන කාර්යයන් ද නිම කර ඇත.

**පූර්වකාලීන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**

ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය ආරම්භ කළ 1737 වසරේ සිට ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ආරම්භ කළ 1963 වසර දක්වා ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. මේ යටතේ 1901 -1940 කාල පරිච්ඡේදය ආවරණය කරමින් සම්පාදනය කරනු ලබන දෙමළ ග්‍රන්ථ ඇතුළත් කෙටුම්පත සංරක්ෂණය කරමින් ඇති අතර 1941-1961 කාල පරාසයේ රැස්කළ තොරතුරු පරීක්ෂා කරමින් පවතී.

**ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව**

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරනු ලබන සිංහල දෙමළ හා ඉංග්‍රීසි වාර සඟරාවල ඇතුලත් ලිපි පිළිබඳ තොරතුරු පාඨකයන් හට පහසුවෙන් සොයාගැනීම සඳහා මෙම වාර සඟරා අනුක්‍රමණිකාව සම්පාදනය කෙරේ. මෙය ත්‍රෛමාසික ප්‍රකාශනයකි. මෙම වසර තුළ 2010 අප්‍රියෙල් - ජුනි සිට 2011 ජනවාරි - මාර්තු දක්වා කලාප 04ක සම්පාදන කටයුතු නිමකර ප්‍රකාශයට පත් කරන ලදී.

**ජාතික පුස්තකාල ද්‍රව්‍ය සුචිගත කිරීම**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට ලබා ගන්නා ලද සියලු ම පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ නිවැරදි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කොට සුචි පත්‍රිකා සකස් කිරීමත්, ජාතික පුස්තකාල සුචිය පවත්වාගෙන යාමත් මෙම අංශයේ කාර්යයක් වේ. ජාතික පුස්තකාල එකතුව පිළිබඳ තොරතුරු පාඨකයින්ට ලබා ගැනීමේ එක ම මාර්ගය ජාතික පුස්තකාල සුචිය වේ. එබැවින් ජාතික පුස්තකාල සුචිය විද්‍යාත්මකවත්, පහසුවෙන් තොරතුරු ලබාගත හැකි ආකාරයෙනුත් සකස් කෙරේ. ජාතික පුස්තකාලය සඳහා අත්පත් කරගන්නා පුස්තකාල ද්‍රව්‍ය අන්තර්ජාතික ප්‍රමිති අනුව සුචිගත කිරීම, වර්ග කිරීම හා කොන්ග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ යෙදීම මෙන් ම පරිගණකගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. 2011 වර්ෂය අවසන් වන විට පුස්තකාල ද්‍රව්‍ය 9258 ක් පරිගණකගත කරන ලදී.

**සාධිකාර ලේඛන සම්පාදනය**

පුස්තකාලවලට සුචිකරණ කටයුතුවල දී අත්‍යවශ්‍ය වන ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ නාම සාධිකාර ලේඛනයක් (Authority list of titles) නො තිබීම මෙතෙක් මේ රටේ පැවැති විශාල අඩුපාඩුවකි. එක ම කර්තෘවරයාගේ නම විවිධාකාරයෙන් කෘතිවල යෙදෙන අවස්ථාවල දී, එම කෘති සුචිගත කිරීම ගැටලු සහගත වේ. මෙම ගැටලුව මඟහරවා ගැනීම කර්තෘ සාධිකාර ලේඛනයක අරමුණ වේ. ඒ අනුව සාධිකාර ලේඛනය (දෙමළ) පිටපත කමිටු සාමාජිකයන් විසින් පරීක්ෂා කරමින් පවතී.

**ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම**

ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue) සම්පාදනය කිරීම හා පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයක් වෙත පැවරෙන ප්‍රධාන කාර්යයක් වේ. රටේ අනෙකුත් ප්‍රධාන පුස්තකාලවල ඇති පොත්පත් සහ වෙනත් පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියක් තුළ අන්තර්ගත විය යුතු ය. ජාතික පුස්තකාලයට පැමිණෙන පාඨකයින්ට අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය ජාතික පුස්තකාලයේ නො මැති නම් ඒවා තිබෙන පුස්තකාල පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචිය මගින් ලබාගත හැකි වේ. මෙය මණ්ඩලයීය නිවහන් පිටුව ( home page) ඔස්සේ ගවේෂණයට ද පහසුකම් සලසා දී තිබේ.

**ප්‍රලේඛන මූලාශ්‍ර සම්පාදනය පිළිබඳ වැඩමුළු පැවැත්වීම.**

මේ යටතේ වැඩමුළු 01 ක් 2011.09.16 දින පැවැත් වූ අතර ඒ සඳහා බාහිර හා ආයතනයේ නිලධාරීන් 15 දෙනෙක් සහභාගී වී ඇත. එමගින් ලද අදායම රු. 20,000.00 ක් වුව ද රු. 11,098.00 ක් වැය වී ඇත.

**ජාතික මට්ටමේ නාමාවලි, අනුක්‍රමණිකා සහ තොරතුරු සංග්‍රහ සම්පාදනය.**

මෙම වසර තුළ ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය. 2009 – 2010 කලාපය සඳහා තොරතුරු රැස්කිරීම සිදුකරන ලදී. ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව යටතේ 2011 වසර තුළ ආයතන 417 වෙත ලිපි යවා තිබේ. මේ සඳහා අදාළ තොරතුරු 2011 වසරේ දී ද රැස් කිරීමට කටයුතු කර තිබේ.

**පර්යේෂණ වාර්තා පිළිබඳ දත්ත පදනම**

ශ්‍රී ලංකාවේ පර්යේෂණ වාර්තා පිළිබඳ දත්ත පදනම නිර්මාණය කරන ලද අතර එහි දෙවන වෙළුම මුද්‍රණය සඳහා ප්‍රකාශන අංශයට යොමුකර තිබේ. මෙම වසර තුළ පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව 2001-2006 වෙළුම. III ග්‍රන්ථය මුද්‍රණය කර ඇත. 2007 – 2010 සඳහා ඇතුළත් කර ඇති සංලේඛ සංඛ්‍යාව 1000 කි.

**ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව සම්පාදනය කිරීම**

මේ යටතේ අදාළ අනුක්‍රමණිකාවේ දත්ත පදනම සඳහා 2011 වර්ෂයේ සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්වල ලිපි අනුක්‍රමණිකාගත කිරීම සඳහා සංලේඛ 2080 ක් ඇතුළත් කර ඇති අතර 2010 වර්ෂයේ දෙමළ දත්ත පදනමට තිනකරන් පුවත්පතෙන් සංලේඛ 632 ක් ඇතුළත් කර තිබේ.

## සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය

ජාතික පුස්තකාල එකතුවට අයත් පුස්තකාල ද්‍රව්‍ය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ. මේ යටතේ ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා නිරතුරුව ම පවිත්‍ර කිරීම්, ධූමායනය, පොත් බැඳීම, අලුත්වැඩියා කිරීම් හා ජාතික පුස්තකාල එකතුව ඇති ප්‍රදේශය වායු සමනය කිරීමත්, ආර්ද්‍රතා පාලනමාන සවි කිරීමත් යනාදී කටයුතු ඉටු කරනු ලබයි.

**පොත් බැඳුම් හල**

ජාතික පුස්තකාලයේ පොත් සංරක්ෂණය කර බැඳීම් කටයුතු කිරීම පොත් බැඳුම් හලේ ප්‍රධාන

කාර්යය වේ. ඒ අනුව පොත් බැඳුම් හල මගින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ❖ පුවත් පත්‍රිකා 171,000 සකස් කිරීම.
- ❖ පරිග්‍රහණ ලේඛන පිටපත් 347ක බැඳුම් කටයුතු සිදු කිරීම.
- ❖ පුවත්පත් ඇසුරුම් පෙට්ටි 288ක් සකස් කිරීම.
- ❖ සංවෘත පුස්තිකා පෙට්ටි 35ක් හා විවෘත පුස්තිකා පෙට්ටි 82 ක් සකස් කිරීම.
- ❖ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන භාණ්ඩ සැකසීම

**ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා මනා ව පවත්වාගෙන යාම.**

ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය හා ආරක්ෂණය සඳහා නිරතුරුව ම පවිත්‍ර කිරීම්, අලුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර තිබේ. පොත් එකතුව ඇති ප්‍රදේශය වායු සමනය කර ඇති අතර එසේ ම, ආර්ද්‍රතා පාලනය සඳහා ආර්ද්‍රතා පාලන යන්ත්‍ර සවිකර ඇත. VHS කැසට් පට 58 ක දිලීර ඉවත්කර DVD වලට පරිවර්තනය කර ඇති අතර අනෙකුත් එකතුවල ආරක්ෂාව සඳහා විශේෂ විධිවිධාන ද යොදා ඇත. අවශ්‍ය අවස්ථාවල දී පාඨක සේවා අංශයේ සංරක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකර තිබේ. විශේෂයෙන් මාර්ටින් වික්‍රමසිංහ එකතුවේ තිබූ කෘමි උවදුර පිළිබඳ විද්‍යාත්මක පරීක්ෂණයක් සිදුකර එම එකතුව ආරක්ෂා කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.

**ධූමායනය**

ජාතික පුස්තකාලයේ පොත් සංරක්ෂණය කිරීමේ ප්‍රධාන ක්‍රියාමාර්ගය වශයෙන් ධූමායනය කිරීම කරගෙන යනු ලැබේ. මේ යටතේ මෙම වසර තුළ පොත් 1052 පොස්පීන් ධූමායනය කරන ලදී. මෙයට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකු පුස්තකාලයට අයත් පොත් 66 ක්, බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ පොත් 295 ක් හා පෞද්ගලික පොත් එකතුවක පොත් 43 ක් පොස්පීන් ධූමායනය සිදුකරන ලදී. තව ද ජාතික පුස්තකාල එකතුවට අයත් පොත් 713 ක් තයිමෝල් ධූමායනයට භාජනය කර ඇත.

**ලේඛන ප්‍රතිසංස්කරණ ඒකකය පවත්වාගෙන යාම**

මේ යටතේ පහත සඳහන් පරිදි ලේඛන ප්‍රතිසංස්කරණ හා බැඳුම් කටයුතු සිදුකරන ලදී.

- ❖ The Colombo Museum පොතෙහි පිටු 26 ක් නිරාම්ලිකරණය කිරීම හා ටිෂූ යොදා සැදීම.
- ❖ විනයවට්ට කථා පොත පිටු 231 ක් පිරිසිදු කර නිරාම්ලිකරණය කිරීම හා පිටු 184 ක් ටිෂූ යෙදීම.
- ❖ The Legislative Enactments of Ceylon ග්‍රන්ථයේ පිටු 329 ක් වියලි පිරිසිදු කිරීම හා පිටු 328 ක් නිරාම්ලිකරණය කිරීම හා ටිෂූ යෙදීම.
- ❖ The Right Honorable පොතෙහි පිටු 206 ක් පිරිසිදු කිරීම හා පිටු 186ක් නිරාම්ලිකරණය කිරීම හා ටිෂූ දැමීම.
- ❖ මාතලේ නාඩගම් පොතෙහි පිටු 508 ක් පිරිසිදු කිරීම හා පිටු 518 ක් නිරාම්ලිකරණය කිරීම හා ටිෂූ දැමීම.
- ❖ History of the Public Works පොතෙහි පිටු 334 ක් පිරිසිදු කර පිටු 288 ක් නිරාම්ලිකරණය කිරීම හා ටිෂූ යෙදීම.
- ❖ Colonial Adversary Council of agriculture පොතේ පිටු 202 ක් පිරිසිදු කර පිටු 124 ක් ටිෂූ යෙදීම
- ❖ Sanskrit English Dictionary ග්‍රන්ථයේ පිටු 394 ක් වියලා පිරිසිදු කිරීම හා පිටු 405 ක් නිරාම්ලිකරණය කර ටිෂූ යෙදීම
- ❖ The indian Tabbaco duty 1910 හි පිටු 360 ක් වියලා පිරිසිදු කිරීම, පිටු 548 ක් නිරාම්ලිකරණය කර ටිෂූ යෙදීම කරන ලදී.
- ❖ මාධ්‍ය සිද්ධාන්ත කෞමුදිය පිටු 112 ක් ටිෂූ යෙදීම

## MOW ජාතික කමිටුව (Memory of the world)

අස්පර්ශණීය සංස්කෘතික උරුමයන් (Intangible Cultural Heritage) පිළිබඳ ක්‍රියාකාරී කමිටුවේ කමිටු රැස්වීම් 02ක් හා ICH කමිටු රැස්වීම් 07 ක් පවත්වා තිබේ. මේ යටතේ The Field Survey of the ICH Safeguarding efforts in Sri Lanka සමීක්ෂණය සිදුකරන ලද අතර ඒ සඳහා ද. කොරියාවේ ආසියා පැසිෆික් කලාපීය අස්පර්ශණීය සංස්කෘතික උරුමය පිළිබඳ මධ්‍යස්ථානය (ICHCAP) ආධාර කරන ලදී.

**ව්‍යසන කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කිරීම.**

මෙහි කමිටු රැස්වීම් 02 ක් පවත්වන ලදී. මේ යටතේ මණ්ඩලයීය නිලධාරීන් පිරිසකට ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවෙන් පුහුණුවක් දී ඇති අතර ඔවුන් හදිසි ගිනි නිවීම් කණ්ඩායම ලෙස නම් කර තිබේ. තව ද ප්‍රථමාධාර කණ්ඩායමක් පත්කර ඔවුන්ට ශාන්ත ජෝන් ගිලන් රථ සේවය මගින් පුහුණුවක් ලබා දී තිබේ.

**පොත් බැඳුම් ද්‍රව්‍ය අලෙවි කිරීම**

බැඳුම් ද්‍රව්‍ය කට්ටල 30ක් හා බැඳුම් උපකරණ කට්ටල 13 ක් වශයෙන් අලෙවි කිරීමට කටයුතු කර තිබේ.

**උපදෙස් පත්‍රිකා පෝස්ටර් නිර්මාණය**

2011 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් ප්‍රචාරක කටයුතු පුළුල්ව සිදුකර ඇති අතර ඒ වෙනුවෙන් සමරු කලාපයක් පළ කිරීම, පුවත්පත් දැන්වීම් හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් කිහිපයක් පැවැත්වීම සහ පුවත්පත්වල ලිපි 07ක් පමණ පළ වී තිබේ.

## පුස්තකාල පර්යේෂණ අංශය

මේ යටතේ දිස්ත්‍රික්ක මට්ටමින් පුස්තකාල සමීක්ෂණය කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ කටයුතු සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක තොරතුරු රැස්කිරීම, පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ තෝරාගත් මාතෘකා පිළිබඳ පර්යේෂණ කිරීම සහ පළ කිරීම, පුස්තකාල කටයුතු පිළිබඳ මාධ්‍ය තොරතුරු රැස්කිරීම හා පර්යේෂණ වැඩමුළු පැවැත්වීම සිදු වේ.

**දිස්ත්‍රික් මට්ටමින් පුස්තකාල සමීක්ෂණය**

කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික්කවල මහජන පුස්තකාල සම්බන්ධයෙන් තොරතුරු දැනට රැස්කර ඇත.

**පුස්තකාල ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු රැස්කිරීම**

2010 වසරට අදාළ තොරතුරු දැනට රැස්කර ඇති අතර ඒ අනුසාරයෙන් Statistical Handbook on Libraries in Sri Lanka - 2010 තොරතුරු සංග්‍රහය මුද්‍රණයේ පවතී.

**තෝරාගත් මාතෘකාවක් පිළිබඳ පර්යේෂණයක් කිරීම**

මෙහි දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ දැනට කරන සේවාවන්වල තත්වයන් පිළිබඳ පුස්තකාල වෘත්තිකයන්ගේ ආකල්ප දැනගැනීම සම්බන්ධයෙන් පර්යේෂණයක් ආරම්භ කර ඇත.

**පර්යේෂණ වැඩමුළු සංවිධානය කිරීම**

පුස්තකාල පර්යේෂණ ක්‍රමවිද්‍යාව පිළිබඳ 2011.06.10 හා 2011.11.03 දිනවල වැඩමුළු 02 ක් මෙම වසර තුළ පවත්වා ඇති අතර ඒ සඳහා 44 දෙනෙකු සහභාගී වී තිබේ. මේ තුළින් ආයතනයට ලැබුණු ශුද්ධ ආදායම රු. 5660/= කි.

## ව්‍යාප්ති සේවා අංශය

මෙම අංශයේ කාර්යභාරය වනුයේ රට තුළ විසිර ඇති විවිධ පුස්තකාල සහ ජාතික මට්ටමින් පුස්තකාල සඳහා උපදේශක සේවා සහ සංවර්ධන ආධාර සැපයීම, පළාත් සභා පුස්තකාල සේවා මණ්ඩල සංවර්ධන ව්‍යාපෘතිය, පුස්තකාල සමීක්ෂණ පැවැත්වීම, කියවීමේ රුචිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම හා හොඳම පුස්තකාලය තේරීම වැනි ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කිරීම යි.

**ජාතික කියවීමේ මාසය**

- 2010 වසරේ ජාතික කියවීමේ මාසය වෙනුවෙන් ලද වාර්තා 198 ක් විශ්ලේෂණය කර ඇති අතර දිස්ත්‍රික්ක අනුව ගොනු කිරීම.
- 2011.11.04 දින ජාතික උත්සවය අන්තර්ජාතික මූල්‍ය සබඳතා පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය ටී.බී.ඒකනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්විණි. මෙම අවස්ථාවට කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික පාසැල්වල සිසුන් හා ගුරුවරුන්, සම්භාව්‍ය අමුත්තන් සමඟ 500ක් පමණ සහභාගී වූහ.
- මීට අමතර ව උත්සවයට පැමිණි සම්මානලාභී සියලු පුස්තකාල සඳහා රු. 7500/= ක් වටිනා පොත් හා ජාතික පාසැල් සඳහා රු. 10,000/= ක් වටිනා පොත් කට්ටලය බැගින් කට්ටල 95 ක් පිරිනමන ලදී.
- 2011 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් සමරු කලාපයක් සකස් කරන ලද අතර විශාල ප්‍රමාණයේ බැනරයක් සකසා ප්‍රදර්ශනය කර ඇත.

**කියවීමේ රුචිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

- ❖ මේ සම්බන්ධයෙන් ලැබෙන දත්ත පරිගණකගත කරමින් පවතී. 2011 වර්ෂයේ දී දත්ත 6000ක් පමණ අතුළත් කර ඇති අතර එම දත්ත විශ්ලේෂණය සඳහා තාක්ෂණික කමිටු සාමාජිකයෙකුට භාරකර ඇත.

**පුස්තකාල ක්ෂේත්‍රයේ විශේෂ දින සැමරීම**

මේ යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

1. ලෝක ළමා පොත් දිනය (අප්‍රේල් 02) වෙනුවෙන් උතුරුමැද හා දකුණු පළාත් පාසැල් ළමුන් අතර නිර්මාණ තරඟාවලියක් ආරම්භ කළ අතර එහි දී නිර්මාණ 200ක් පමණ ලැබී තිබේ.
2. මහජන පුස්තකාල දිනය සැමරීම වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ දී උත්සවයක් පැවති අතර එය 2011.07.18-19 යන දිනවල පැවැත්විය. මේ සඳහා පුස්තකාලයාධිපතීන් 67ක් සහභාගී වූ අතර එම දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල සඳහා රු. ලක්ෂ 04ක් පමණ වටිනා පොත් බෙදා දෙන ලදී.

**දේශීය පුස්තකාල ව්‍යවස්ථා, නීතිරීති හා චක්‍රලේඛ**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පැවැති පළාත් පාලන ආයතනයන්හි මාසික ප්‍රගති සමාලෝචන කමිටු රැස්වීම්වලට සහභාගිවීම.

**පොත් ආධාර සැපයීමේ ව්‍යාපෘතිය**

පුස්තකාල කටයුතු සංවර්ධනය කිරීමේ එක් මාර්ගයක් ලෙස පුස්තකාල වෙත පොත් ආධාර ලබා දීමේ ක්‍රමයක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරයි. ඒ අනුව මෙම වසර තුළ පාසැල් පුස්තකාල 176 ක්, මහජන පුස්තකාල 42ක්, පිරිවෙන් හා දහම් පාසල් පුස්තකාල 19 ක්, ආරක්ෂක අංශයේ පුස්තකාල 05 ක් වෙනත් පුස්තකාල 21ක් වශයෙන් පුස්තකාල 263 ක් සඳහා රු.1,881,735.00 ක් වටිනා පොත් පරිත්‍යාග කර ඇත.

**පොත් ප්‍රදර්ශන**

2011 වසර තුළ පොත් ප්‍රදර්ශන 06ක් සංවිධානය කර තිබේ. ඒ අනුව

01. දැයට කිරුළ පොත් ප්‍රදර්ශනය 2011.02.04 සිට 10 දක්වා මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල දී පැවති අතර ඒ සඳහා සහභාගි විය.
02. සිංහල හින්දු අලුත් අවුරුදු පොත් ප්‍රදර්ශනය 2011.04.06 සිට 09 දක්වා ජාතික පුස්තකාල භූමියේ දී පැවැත්විණි.
03. පොසොන් උත්සවය නිමිත්තෙන් මිහින්තලේ දී 2011.06.11 සිට 16 දක්වා පොත් ප්‍රදර්ශනයක් පැවැත්විය.
04. මහනුවර කැන්ඩි සිටිහි දී 2011.06.30 සිට 2011.07.03 දක්වා පොත් ප්‍රදර්ශනයක් පැවැත්විණ.
05. රාජ්‍ය සාහිත්‍ය උත්සවයට සමගාමී ව කුරුණෑගල දී 2011.09.01 සිට 12 දක්වා පැවති ප්‍රදර්ශනය සඳහා අප මණ්ඩලය විසින් පොත් ප්‍රදර්ශනයක් පැවැත්විය.
06. 2011 අගෝස්තු 19-26 දක්වා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී (BMICH) පැවති අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනයට සහභාගී වීම.

මෙම ප්‍රදර්ශනවල දී අලෙවියෙන් ලැබූ ආදායම රු. 2,487,972.20 කි.

**පුස්තකාල ශ්‍රේණිගත කිරීම**

පුස්තකාල ශ්‍රේණිගත කිරීම මෙම ආයතනයෙන් ඉටු කෙරෙන ප්‍රධාන කාර්යයකි. ඒ අනුව මෙම වසර තුළ දී පුස්තකාල 04 ක් පළමු ශ්‍රේණියටත් 06 ක් දෙවන ශ්‍රේණියටත් 19ක් තුන්වන ශ්‍රේණියට ශ්‍රේණිගත කරන ලදී. පුස්තකාල ශ්‍රේණිගත කිරීම වෙනුවෙන් රු. 72,000.00 ක ආදායමක් ලැබී ඇත.

**ජාතික පුස්තකාල පොත් අලෙවි හල**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන, කර්තෘ ප්‍රකාශන සහ මණ්ඩලය මඟින් ප්‍රකාශයට පත්කරන ප්‍රකාශන 40% වට්ටම යටතේ ජාතික පුස්තකාල පොත් හලෙහි අලෙවි කෙරේ. මෙම ප්‍රකාශන පුස්තකාල සඳහා විශේෂ සහන මිලකට ලබා දේ. මීට අමතර ව මෙම වසරේ දී විශේෂ වට්ටම් යටතේ අලෙවි කිරීමට බාහිර ආයතනවලින් පොත් ලබාගෙන තිබේ. ජාතික පුස්තකාල පොත්හල මඟින් පුස්තකාලවලට පහසුවෙන්, සහන මිලකට ප්‍රමිතියට අනුකූල පුස්තකාල ලිපිද්‍රව්‍ය ලබාගැනීමට අවස්ථාව සලස්වා ඇත. මෙම වසර තුළ පොත් අලෙවි හලෙහි මුළු ආදායම රු. 1,959,111.30 කි.

## හොඳම පුස්තකාලය තේරීම

දිවයිනේ හොඳම පාසැල් හා මහජන පුස්තකාල තේරීමේ වැඩසටහන් මේ වසරේ දී ආරම්භ කළ අතර ඒ සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම හා අදාළ විස්තර පත්‍රිකා තැපැල් මගින් යැවීම යන පූර්ව කටයුතු සිදුකරන ලදී. මේ සම්බන්ධයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල පාසැල් වෙනුවෙන් සම්මන්ත්‍රණයක් 2011.05.24 දින පැවති අතර ඒ සඳහා නිලධාරීහු 47 ක් සහභාගි වූහ. උතුරු මැද පළාතේ මහජන පුස්තකාල සඳහා 2011.06.07 - 08 දිනවල අදාළ සම්මන්ත්‍රණ පැවති අතර ඒ සඳහා 45 දෙනෙක් සහභාගි වූහ.

## අධ්‍යාපන හා පුහුණු අංශය

අධ්‍යාපන හා පුහුණු අංශයේ අරමුණ පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන අධ්‍යාපන හා පුහුණු වැඩමුළු පැවැත්වීම මගින් ඔවුන්ට අඛණ්ඩ වෘත්තීය පුහුණුවක් ලබා දීම වේ. මහජන, පාසැල්, පිරිවෙන් ආදී විවිධ වර්ගවලට අයත් පුස්තකාලයාධිපතීන් සඳහා කෙටිකාලීන පුස්තකාල විද්‍යා වැඩමුළු පැවැත්වීම, පුස්තකාල විද්‍යා සම්මන්ත්‍රණ සහ දේශන පැවැත්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

### පාසැල් පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩමුළු/ සම්මන්ත්‍රණ

දිවයිනේ පාසැල් පුස්තකාල සඳහා ස්ථිර වෘත්තීය පුස්තකාලයාධිපතීන් ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවක් බැවින් මෙම ගැටළුව මග හරවා ගනු වස් පාසැල් පුස්තකාල භාරව කටයුතු කිරීමට ගුරුවරුන් යොදාගනු ලැබේ. මෙම ගුරුවරුන්ට පුස්තකාල විද්‍යාව පිළිබඳ අවබෝධයක් ලබා දීම පිණිස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් පුහුණු වැඩමුළු පවත්වනු ලබයි. ඒ සඳහා සහයෝගය ලබා දෙනුයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඒ ඒ පළාත් භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසිනි. ඒ අනුව පහත සඳහන් පුහුණු වැඩමුළු සංවිධානය කර ඇත.

01. හොරණ කලාපයේ පාසැල් පුස්තකාල කාර්ය මණ්ඩල නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් 2011.01.24 - 25 දිනවල ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවති අතර ඒ සඳහා පුහුණු ලාභීන් 45 ක් සහභාගි වූහ.
02. මොනරාගල දිස්ත්‍රික්කයේ පාසැල් පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩමුළුවක් 2011.01.25-26 දිනවල බිබිල හා මොනරාගල ප්‍රදේශවල පැවති අතර ඒ සඳහා පුහුණු ලාභීන් 104 පැමිණ ඇත.
03. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අධ්‍යාපන කලාපයේ පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණු කිරීමේ වැඩමුළුවක් 2011.04.28 - 29 දිනවල පැවති අතර ඒ සඳහා 39 දෙනෙකු සහභාගි වූහ.
04. දිවයිනේ සියලු ම අධ්‍යාපන කලාප කාර්යාලවල අධ්‍යක්ෂවරුන් වෙනුවෙන් හොඳම පුස්තකාලය තේරීම පිළිබඳ වැඩමුළුවක් 2011.05.24 දින ජාතික පුස්තකාලයේ දී පැවති අතර ඒ සඳහා නිලධාරීන් 60 දෙනෙකු සහභාගි වී තිබේ.
05. මීගමුව කලාපයේ පාසැල් පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩමුළුවක් 2011.05.25 - 26 දිනවල ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත් වූහ. ඒ සඳහා පුහුණු ලාභීන් 50ක් දායක වී ඇත.
06. ගම්පොළ අධ්‍යාපන කලාපයේ පාසැල් පුස්තකාල කාර්ය මණ්ඩල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2011.06.22 දින ගම්පොළ සහිරා විද්‍යාලයේ දී පැවති අතර ඒ සඳහා පුහුණු ලාභීන් 40ක් සහභාගී වූහ.
07. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පාසැල් පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ වැඩමුළුවක් 2011.06.27 හා 28 දිනවල දී පැවති අතර මෙයට 110ක් සහභාගි වූහ.
08. කෑගල්ල අධ්‍යාපන කලාපයේ වැඩමුළුවක් 2011.08.01 හා 02 දිනවල පැවති අතර පුහුණු ලාභීන් 75 ක් සහභාගි වූහ.
09. කියවීමේ මාසය වෙනුවෙන් පුස්තකාලයාධිපතීන් සඳහා සම්මන්ත්‍රණයක් 2011.10.21 දින පැවැත් වූ අතර එයට 55 දෙනෙක් සහභාගී වී ඇත.

10. කුරුණෑගල මහව අධ්‍යාපන කලාපයේ පාසැල් සිසුන් සඳහා කියවීමේ රුචිය පිළිබඳ සම්මන්ත්‍රණයක් 2011.11.11 දින නක්වත්තාගම කනිෂ්ඨ විද්‍යාලයේ දී පැවති අතර මෙයට සිසුන් 250 ක් පමණ සහභාගී වූහ.
11. දෙනුවර අධ්‍යාපන කලාපයේ පාසැල් පුස්තකාලයාධිපතීන් සඳහා සම්මන්ත්‍රණයක් කඩුගන්නාව ජාතික පාසලේ දී පැවැත් වූ අතර එයට 77 දෙනෙක් සහභාගී වී තිබේ.

**මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා වැඩමුළු පැවැත්වීම**

1. මොනරාගල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල කාර්ය මණ්ඩල නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුළුවක් 2011.01.26 දින මොනරාගල ගුරු මධ්‍යස්ථානයේ දී පැවැත් වූ අතර එයට පුහුණු ලාභීන් 27 දෙනෙක් දායක විය.
2. බස්නාහිර පළාතේ පුස්තකාලයාධිපති III ශ්‍රේණියට බඳවා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන තරඟ විභාගය අළලා දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් 2011.01.27 හා 29 යන දිනවල ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ අතර එයට අයදුම්කරුවන් 79 ක් සහභාගී වී ඇත. මෙහි දෙවන සම්මන්ත්‍රණය 2011.02.11 හා 25 දිනවල පැවැත් වූ අතර ඒ සඳහා 80 ක් දායක වී තිබේ.
3. බස්නාහිර පළාතේ පුස්තකාලයාධිපතිවරුන් වෙනුවෙන් හොඳම පුස්තකාලය තේරීම පිළිබඳ වැඩමුළු 03 ක් 2011 මාර්තු මස පවත්වා ඇති අතර ඒ සඳහා 315 දෙනෙක් සහභාගී වී තිබේ.
4. කියවීමේ මාසය වෙනුවෙන් 2011.10.25 දින උතුරු පළාතේ පුස්තකාලයාධිපතීන් වෙනුවෙන් සම්මන්ත්‍රණයක් ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවති අතර ඒ සඳහා 40 දෙනෙක් සහභාගී වූහ.
5. පොත් බැඳුම්කරණය පිළිබඳ එක්දින වැඩමුළුවක් 2011.12.28 දින ජාඇල නගර සභාවේ දී පැවැත් වූ අතර එයට පුහුණු ලාභීන් 24 දෙනෙක් සහභාගී වී තිබේ.

## පිරිවෙන් පුහුණු වැඩමුළු

1. 2011.02.21 හා 22 යන දිනවල අම්බලන්ගොඩ වේනමුල්ල භික්ෂු අභ්‍යාස විද්‍යාලයේ දී පිරිවෙන් පුස්තකාල භාරකරුවන් වෙනුවෙන් වැඩමුළුවක් පැවති අතර ඒ සඳහා භික්ෂූන් වහන්සේලා 24 නමක් සහභාගී වූහ.

**සේවාස්ථ පුහුණු වැඩමුළු**

මේ යටතේ විවිධ ආයතනවල පුස්තකාලයන්හි සේවය කරන පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩමුළු 04 ක් 2011.05.23–27, 2011.08.22-26, 2011.09.26-30, 2011.12.19-23 දක්වා මණ්ඩලයේ විවිධ අංශවලට යොමුකර ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දෙන ලදී. මේ සඳහා පුහුණුලාභීන් 18 දෙනෙකු සහභාගි වූ අතර එමගින් රු. 75,000.00/= ක මුදලක් අත්කර ගෙන තිබේ. එසේ ම තවත් එවැනි වැඩමුළු 01ක් 2011.03.21- 2011.04.21 දින දක්වා පැවැත් වූ අතර ඒ සඳහා 14 දෙනෙකු සහභාගි වූහ. මෙය නොමිලේ පවත්වන ලදී.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පුහුණු වැඩමුළු**

තෝරාගත් පුස්තකාල නිලධාරීන් සඳහා වැඩමුළු 10 ක් මෙම වසර තුළ සංවිධානය කර තිබේ. මේ වෙනුවෙන් පාඨමාලාලාභීහු 56 ක් සහභාගි වූහ. එමගින් රු. 196,000.00 ක මුදලක් පාඨමාලා ගාස්තු වශයෙන් අයකරගෙන තිබේ.

**පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන වැඩමුළු හා සම්මන්ත්‍රණ**

මේ යටතේ පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ වැඩමුළු අදියර I යටතේ වැඩමුළු 01 ක් 2011.01.29-31

යන දිනවල මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිලේ දී පැවත් වූ අතර පාඨමාලාලාභීහු 15 ක් සහභාගි වූහ.

අධියර II යටතේ වැඩමුළු 04 ක් පිළිවෙළින් 2011.02.23-25, 2011.05.30-31, 2011.08.03-05, 2011.09.12-13 යන දිනවල ජාතික පුස්තකාලයේ දී ම පැවැත් වූ අතර ඒ සඳහා පාඨමාලා ලාභීහු 46 ක් සහභාගි වූහ.

**ජාතික පුස්තකාල දේශන මාලාව**

මේ යටතේ 2011 වර්ෂය තුළ දේශන 09 ක් පවත්වා ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| (1) රසිකත්වය හා පෞරුෂත්වය | හසන්ත හෙට්ටිආරච්චි මහතා (ජනවාර් 24) |
| (2) කාලගුණික අනතුරු ඇඟවීම් තේරුම් ගමු, භාවිත කරමු | එස් ආර් ජයසේකර මහතා (පෙබරවාර් 23) |
| (3) ස්වාභාවික විපත් හා ජගත් පාරිසරික අරබුද හමුවේ ශ්‍රී ලංකාව | උදය ගම්මන්පිල මහතා (මාර්තු29) |
| (4) ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතය හා බුද්ධිමය දේපල පිළිබඳ හිමිකම් නීතිය | ආචාර්ය ඩී එම් කරුණාරත්න මහතා ( අප්‍රියෙල් 28) |
| (5) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් උදෙසා මාධ්‍ය අධ්‍යාපනය | බන්දුල පී දයාරත්න මහතා (මැයි 25) |
| (6) වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා ජාතික ප්‍රතිපත්තියකට මඟ | අතුරලියේ රතන හිමි (ජුනි 24) |
| (7) බටහිර ලෝකයේ ග්‍රන්ථ ප්‍රකාශනයේ නව ප්‍රවණතා හා නිර්මාණය | හදුජී මහින්ද ජයතිලක මහතා ජූලි 27) |
| (8) දැයේ අස්පර්ශීය උරුමය සුරැකීම සඳහා ජාතික පුස්තකාලයේ වගකීම | පන්ඩුල ඇඳගම මහතා (අගෝස්තු 29) |
| (9) ආශ්වාදය සඳහා කියවීම | මහාචාර්ය ජේ බී දිසානායක මහතා (ඔක්තෝබර් 20) |

**ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය මෙහෙයවීම හා පවත්වාගෙන යාම, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සියලු ම ප්‍රකාශන පළ කිරීම, සම්භාව්‍ය සාහිත්‍ය කෘති සංස්කරණය, පරිවර්තනය හා ප්‍රකාශනය කිරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යභාරය වන අතර, අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ, මාලික සහ සංගීත අංක ව්‍යාපෘති පවත්වාගෙන යාම මෙම අංශය මගින් ඉටු කරනු ලබයි.

**ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය**

පොත් ප්‍රකාශන ආධාර වැඩපිළිවෙළ යටතේ කර්තෘවරුන් හට ඔවුන්ගේ අත්පිටපත් ප්‍රකාශයට පත් කර ගැනීමට ආධාර ලබා දීම මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව 2011 දී මෙම ව්‍යාපෘතිය යටතේ පිටපත් 13ක් අනුමත වී ඇත. ඒවා පහත පරිදි ය.

| අ.අ | කර්තෘගේ නම | අත්පිටපතේ නම |
|---|---|---|
| 1 | පද්මාණි උඩිස්පත්තුව මහත්මිය | සඳුන් සුවඳ |
| 2 | මොහාන් ශ්‍රියන්ත ආරියවංශ මහතා | පරිසර අධ්‍යයනය සහ සිංහරාජය ගවේෂණය |
| 3 | ඩී. තුසිත මැන්දිස් මහතා | ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණය හා සම්පත් පරිහරණය |
| | අශෝක සිරිවර්ධන | |
| 4 | බන්දුල පී. දයාරත්න මහතා | පොඩියන් |
| 5 | ශ්‍රීමා ලාලනී මහත්මිය | මයුර වාපා |
| 6 | ඩබ්ලිව් එම් ටී එන් වික්‍රමසිංහ මහතා | උදාතරී |
| 7 | ලයනල් රාජපක්ෂ | යක්ෂයාගේ හෝරාව |
| 8 | නවනැලියේ විජේතුංග මහතා | අම්මාගේ ගුණ සුවඳ |
| 9 | ආරියපාල රත්නායක මහතා | මතක සිත්තම් |
| 10 | ලලිත් ගුණවර්ධන මහතා | ඩන්කන් වයිට් |
| 11 | එච්. සසන්ත ද සිල්වා මහතා | ජාතික කතා හා සිංහල නාටකය |
| 12 | ආනන්ද අබේවික්‍රම මහතා | මල් වැස්සක් |
| 13 | ආර්.ඩී. ශාන්තිලතා මහත්මිය | අනුරාධපුර යුගයේ භික්ෂු විනය |

**රාජ්‍ය සම්මාන ලද කෘති මිල දී ගැනීම**

මේ යටතේ 2011 වසර තුළ දී සිංහල 12 , දෙමළ 07 , ඉංග්‍රීසි 01 වශයෙන් කර්තෘවරුන්ගෙන් පොත් මිල දී ගන්නා ලදි.

**මණ්ඩලයීය ප්‍රකාශන මුද්‍රණය හා ප්‍රකාශයට පත් කිරීම**

2011 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද මණ්ඩලයීය ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ.

(1) පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව 2001 – 2006 වෙළුම III (පිටපත් 100)
(2) ජාතික පුස්තකාල ප්‍රචාරක අත්පොත ඉංග්‍රීසි පිටපත් (1000)
(3) පර්පාලන වාර්තාව 2008 (පිටපත් 400)
(4) පුස්තකාල ප්‍රවෘත්ති 2010 ජූලි - දෙසැම්බර් (පිටපත් 350)
(5) ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව 2010/2,3,4 (පිටපත් 50 බැගින්)
(6) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 2011/01-08 දක්වා (පිටපත් 250 බැගින්)
(7) Natnet Lanka ප්‍රවෘත්ති පත්‍රිකාව 2011 ජන-මාර්තු,අප්‍රි-ජූනි,ජූලි-සැප් කලාප (පිටපත් 350)
(8) රජයේ ප්‍රකාශන නාමාවලිය - 2008 (පිටපත් 350)
(9) පුරාතන ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය (පිටපත් 100)
(10) පුස්තකාල නාමාවලිය (පිටපත් 500)
(11) සංයුක්ත සැලැස්ම 2012-2014 කෙටුම්පත (පිටපත් 50)

**සම්භාව්‍ය කෘති සංස්කරණය**

පැරණි සම්භාව්‍ය කෘති සංස්කරණය කිරීම ප්‍රකාශන අංශය මගින් මෙහෙයවනු ලබන වැදගත් ව්‍යාපෘතියකි. ඒ අනුව 2011 දී බුත්සරණ ග්‍රන්ථයේ සංස්කරණ කටයුතු සිදුකර ගෙන යනු ලැබේ. මෙහි කමිටු සාමාජිකයන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇති පරිදි එහි සංස්කාරකවරු 09 දෙනෙක් වෙනුවෙන් රු. 38,000/= මුදලක් අදාළ වර්ෂයේ දී ගෙවා තිබේ. 2011.11.30 දින මෙම සංස්කාරක මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කැඳවා තොරතුරු විමසා තිබේ.

### අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය (ISBN)

අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය ප්‍රකාශන අංශය මඟින් මෙහෙයවන තවත් ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකාවේ පළවන සෑම පොතක් සඳහා ම ISBN අංකයක් ලබා ගැනීමට මෙහි පහසුකම් සලසා ඇත. මෙම අංක ලබා ගන්නා ප්‍රකාශකයන් පිළිබඳ තොරතුරු ප්‍රකාශන අංශය විසින් මහා බ්‍රිතාන්‍යයේ පිහිටි අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක මධ්‍යස්ථානය වෙත යවනු ලැබේ. එහි දී අදාළ ප්‍රකාශකයන් පිළිබඳ තොරතුරු පරිගණක හා මුද්‍රිත මාධ්‍යයන් මඟින් ලෝකය පුරා බෙදා හැරේ. 2011 වසර තුළ මෙම ව්‍යාපෘතියට අලුතින් ලියාපදිංචි වූ ප්‍රකාශකයන්ගේ සංඛ්‍යාව 1107කි. මෙම වසර තුළ ISBN අංක ලබාගෙන ප්‍රකාශනයට සැලසුම් කර ඇති ග්‍රන්ථ සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| ප්‍රකාශක වර්ගය | ග්‍රන්ථ නාම සංඛ්‍යාව |
|---|---|
| වාණිජ මට්ටමේ ප්‍රකාශකයින් | 6759 |
| රජයේ සහ රජයේ නො වන ආයතනික ප්‍රකාශකයින් | 1137 |
| කර්තෘ/පෞද්ගලික ප්‍රකාශකයින් | 2340 |
| එකතුව | 10236 |

2011 වර්ෂයේ ISBN අංක ලබා දීම වෙනුවෙන් ලැබුණු මුළු ආදායම රු. 511,800.00 කි.

### අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක ව්‍යාපෘතිය (ISSN)

මෙම ව්‍යාපෘතිය 1993 වර්ෂයේ දී ආරම්භ කළ අතර මේ මඟින් ශ්‍රී ලංකාවේ පළවන සියලු ම මාලික ප්‍රකාශනවලට ප්‍රමිති අංක නිකුත් කෙරේ. මීට ඉහතින් සඳහන් කළ අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය යටතේ පොත්වලට ලැබෙන සියලු ම වරප්‍රසාද හා පහසුකම් මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ පළවන වාර ප්‍රකාශනවලට ලැබේ. මෙහි ජාත්‍යන්තර මධ්‍යස්ථානය ප්‍රංශයේ පැරිස් නගරයේ පිහිටා ඇත. 2011 වසර තුළ දී රජයේ හා රජයේ නො වන මාලික ප්‍රකාශන 217 ක් සඳහා ISSN අංක ලබා දී ඇත. එය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රකාශක වර්ගය | මාලික නාම සංඛ්‍යාව |
|---|---|
| වාණිජ මට්ටමේ ප්‍රකාශකයින් | 76 |
| රජයේ සහ රජයේ නො වන ආයතනික ප්‍රකාශකයින් | 109 |
| කර්තෘ/පෞද්ගලික ප්‍රකාශකයින් | 32 |
| එකතුව | 217 |

2011 වර්ෂයේ ISSN අංක ලබා දීම වෙනුවෙන් 10,850.00 ක ආදායමක් ලැබී ඇත.

### අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක ව්‍යාපෘතිය (ISMN)

අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක ව්‍යාපෘතිය ප්‍රකාශන අංශය මෙහෙයවන තවත් ව්‍යාපෘතියකි. මේ යටතේ මෙම වසර තුළ දී ප්‍රකාශකයින් 03 දෙනෙකු ලියාපදිංචි කරන ලද අතර, ලබාදුන් ISMN අංක සංඛ්‍යාව 03 කි. 2011 වර්ෂයේ ISMN ලබා දීම වෙනුවෙන් රු. 150.00 ක සේවා ගාස්තුවක් අයකර ගන්නා ලදි. එය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රකාශක වර්ගය | ප්‍රකාශන සංඛ්‍යාව |
|---|---|
| කර්තෘ/ පෞද්ගලික ප්‍රකාශකයින් | 03 |

**නව ප්‍රකාශන මිල දී ගැනීම**

මේ යටතේ 2010 වසරේ සිංහල ග්‍රන්ථ නාම 108ක්, දෙමළ 07 ක් හා ඉංග්‍රීසි 05 ක් වශයෙන් අනුමත වී ඇත. 2011 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ සිංහල ග්‍රන්ථ නාම 244 ක්, දෙමළ ග්‍රන්ථ නාම 37 ක් සහ ඉංග්‍රීසි ග්‍රන්ථ 14 ක් ලෙස ග්‍රන්ථ නාම 295 ක් අනුමත වී තිබේ.

**පුස්තකාල සහයෝගිතා අංශය**

පුස්තකාල ව්‍යවස්ථා සංශෝධනය කිරීම, මණ්ඩලයීය ප්‍රකාශන බෙදා හැරීම, පාඨක සමාජ නගාසිටුවීම, පුස්තකාලවලට බෙදාහැරීම සඳහා පොත් පරිත්‍යාග ලබාගැනීම, ලේඛක නාමාවලි සැකසීම හා විවිධ පුස්තකාල අතර සහයෝගිතා වැඩසටහන් සංවිධානය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ.

* පුස්තකාල ව්‍යවස්ථා සංශෝධනය කිරීම

මේ යටතේ පුස්තකාල ක්ෂේත්‍රයේ සිටින වෘත්තීය සමිති නියෝජිතයන් හා ඒකාබද්ධ අධ්‍යක්ෂ (රාජ්‍ය පරිපාලන) අතර හමුවක් 2011.03.11 දින පැවැත්විය. මෙහි දී සංශෝධන හා සේවා ව්‍යවස්ථාව පිළිබඳ සාකච්ඡා විය

* පුස්තකාල ප්‍රවෘත්ති සඟරාව පළ කිරීම

මණ්ඩලය විසින් පළ කරනු ලබන පුස්තකාල ප්‍රවෘත්ති සඟරාව 2010 ජූලි - දෙසැම්බර් කලාපය පළ කිරීමට කටයුතු කරන ලදී.

* මණ්ඩලයීය ප්‍රකාශන දායකත්වය

2011 වසර තුළ වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව දායකත්ව පුස්තකාල සංඛ්‍යාව 26 ක් වන අතර ජාතික ග්‍රන්ථ නාමාවලිය සඳහා පුස්තකාල 73 ක් දායකත්වය ලැබ තිබේ.

**ක්‍රමෝපායන සැලැසුම් අංශය**

මණ්ඩලයේ සියලු ම අංශවල කටයුතු සැලැසුම් කිරම, අධීක්ෂණය කිරම හා සම්බන්ධීකරණය කිරම ක්‍රමෝපායන සැලැසුම් අංශය මඟින් ඉටු කෙරේ. මීට අමතර ව පාලන කටයුතු විධිමත් ව කරගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු කිරම ද මෙම අංශයේ වගකීම වේ.

මණ්ඩලයේ විවිධ අංශවල වාර්ෂික, අර්ධ වාර්ෂික හා මාසික ප්‍රගති වාර්තා පවත්වාගෙන යෑම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04 ක් සංවිධානය කිරම මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම,

2008 පරිපාලන වාර්තා සකස් කිරම, අදාළ දත්ත හා සංඛ්‍යා ලේඛන රැස් කිරම, මණ්ඩලයීය නිලධාරීන්ගේ විදේශ පුහුණුවීම්, ආයතනයේ කෙටි කාලීන සහ දිගු කාලීන කටයුතු සැලසුම් කිරම, විවිධ විමසීම් සඳහා පිළිතුරු සැපයීම මණ්ඩලයීය විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම පිළිබඳ ව අධීක්ෂණ කටයුතු 2012 වර්ෂය සඳහා වාර්ෂික සැලැස්ම පිළියෙල කිරමේ දී එහි මූලික සැලසුම් සකස් කිරම ආදී කටයුතු ද ආයතනයේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශයන් වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනයන්ට ලක් කොට එහි අවසන් වාර්තාව පිළියෙල කර ඇත. උතුරු නැගෙනහිර විශේෂ පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ වාර්තාවක් සැකසීම. මෙම වසර තුළ දී ඉටු කර තිබේ. මීට අමතර ව මණ්ඩලයීය විවිධ ව්‍යාපෘති පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යෑම් ආදී කටයුතු ද ඉටු කර ඇත.

**පරිපාලන අංශය**

මෙම වසර තුළ ආයතනයේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරමට අදාළ ව කටයුතු සිදු කිරම, නව බඳවා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරම, බඳවාගැනීමේ පරිපාටි සකස් කිරම, වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු, ආපදා ණය, පාපැදි ණය, වැටුප් වර්ධක ලබා දීම, විවිධ අංශවල අවශ්‍යතා අනුව වාහන නිකුත් කිරම් කරන ලදී. මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ PC 3588 ඩබල් කැබ් රථයක් ගැනීම මෙම වසරේ දී සිදු විය. ඊට අමතර ව දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබා දීමට කටයුතු කිරම, ආරක්ෂක සේවා පිළිබඳ කටයුතු, විදේශ පාර්සල් නිරවුල් කිරම, සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් ලබා දීම, විවිධ අවශ්‍යතා සඳහා පොත් කට්ටල නිකුත් කිරම, නිවාඩු ලේඛන යාවත්කාලීන කිරම, සාමාන්‍ය/ ලියාපදිංචි ලිපි , පාර්සල් තැපැලට

යොමු කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු මෙම වසරේ සිට ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇති අතර ඒ යටතේ පුස්තකාල පර්යේෂණ හා පුස්තකාල සහයෝගිතා වශයෙන් අංශ 02ක් ස්ථාපිත කරන ලදී. මීට අමතර ව ප්‍රලේඛන සේවා අංශය ඉවත් කොට එය ග්‍රන්ථ විඥාපන පාලන අංශයට ඒකාබද්ධ කර ඇති අතර පුස්තකාල සංවර්ධන අංශය ව්‍යාප්ති සේවා වශයෙන් වෙනසක් වී ඇත.

## ඉදි කිරීම් හා නඩත්තු අංශය

2011 වර්ෂය තුළ මධ්‍යගත වායු සමීකරණ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු නිම කර අදාළ සේවා කටයුතු සඳහා යොමු කිරීමත් ගොඩනැගිල්ලේ අනෙකුත් සවි කිරීම් වන සෝපානය සහ ගිනි අනතුරු සංඥා පද්ධතිය සඳහා 2011 වර්ෂයට සේවා ගිවිසුම් අත්සන් කර ඒ අනුව කටයුතු සිදු කිරීමත් මෙයට අමතර ව වායු සමීකරණ පද්ධතිය හා විදුලි පද්ධතියේ අනෙකුත් අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

2011 වසර සඳහා නව සනීපාරක්ෂක සේවා ආයතනයක් තෝරා ගැනීම වෙනුවෙන් අවශ්‍ය පූර්ව කටයුතු සිදු කර තිබේ. මෙම කටයුතුවලට අමතර ව දෛනික කාර්යාල කටයුතු සඳහා පරිගණක, ඡායා පිටපත් අනෙකුත් යන්ත්‍ර ආදිය අදාළ නියෝජිතයින් මාර්ගයෙන් අවශ්‍ය පරිදි සේවා සහ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර මණ්ඩලයීය භූමියේ නඩත්තු කටයුතු මනා ව පවත්වාගෙන යෑමට අවශ්‍ය පියවර ගෙන තිබේ. මණ්ඩලයීය අභ්‍යන්තර මාර්ග පද්ධතියේ කොටසක් කාපට් කිරීම, ගොඩනැගිල්ලේ පින්තාරු කිරීම, ජනෙල් සඳහා නව තිරරෙදි යෙදීම, ජල මාර්ග හා වැසිකිලි පද්ධතියේ අලුත්වැඩියාව හා අවශ්‍යතා පරිදි අංශවල පාටිෂන් කිරීමේ කටයුතු සිදුකරන ලදි. 2011 වර්ෂය තුළ ආයතනයේ ශ්‍රවණාගාරය සහ සම්මන්ත්‍රණ ශාලාව කුලියට දීමෙන් රු.1,137,100.00ක මුදලක් මණ්ඩලයට ලැබී තිබේ.

## ගිණුම් හා ගෙවීම් කටයුතු

මෙම වසර තුළ 2011 වර්ෂයට අයත් අයවැය ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමත්, මාසික ව පිළියෙල කළ මුදල් පුරෝකථන වාර්තා හා ලැබීම් හා ගෙවීම් විස්තර ඇතුළත් කර අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමත් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ලබා ගැනීම සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් විස්තර ද ඇතුළත් කර පිළියෙල කරන ලද මුදල් පුරෝකථන වාර්තාව අමාත්‍යාංශ ලේකම් මඟින් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

මෙයට අමතර ව මණ්ඩලයේ ලැබීම් හා ගෙවීම්, මුදල් පොත් පරිගණකගත කරන ලද අතර මාසික වාර්තා හා අවසන් ගිණුම් වාර්තා සකස් කිරීමේ පහසුව පිණිස විශ්ලේෂණ වාර්තා පිළියෙල කර තිබේ. මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලද මුදල් හා මණ්ඩලයේ ඉපයීම් ද අයවැයගත සීමාවන් යටතේ ගෙවීම් කිරීම සඳහා ද උපයෝගී කර ගන්නා ලද අතර රජයේ විගණන අංශයෙන් ලැබුණු විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමත්, සියලු ම බැංකු ගිණුම්වලට අදාළ ලැබීම් හා ගෙවීම් මුදල් පොත් මාසික ව යාවත්කාලීන ව පවත්වාගෙන යෑමට ද කටයුතු කර ඇත.

මුදල් පොත් යාවත්කාලීන ව පවත්වාගෙන ගිය අතර සේවක වැටුප්, අතිකාල, ගමන් වියදම් හා අනෙකුත් දීමනා යනාදී ගෙවීම් කටයුතු නියමිත දිනවල දී සිදු කරන ලදී. පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් කලට වේලාවට නො ලැබුණු අතර මණ්ඩලය විසින් උපයන ලද මුදල් ද අයවැයගත සීමාවන් යටතේ ගෙවීම් සඳහා යොදාගෙන තිබේ.

ලැබීම් ගෙවීම් පිළිබඳ විස්තර සහිත ව මුදල් පුරෝකථන වාර්තාව පිළියෙල කර අමාත්‍යාංශ ලේකම් මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට මාස්පතා ඉදිරිපත් කර මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලදී. මණ්ඩලයට ලැබෙන අනෙකුත් ආදායම් නිසි පරිදි ලබා ගැනීමට පියවර ගැනීමත්, මාසික ගිණුම් වාර්තා නිසි පරිදි සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කර අධ්‍යාපන අමාත්‍යාංශයට දැන ගැනීම සඳහා ද යොමු කර ඇත. මෙයට අමතර ව ලැබීම් හා ගෙවීම් මුදල් පොත් පරිගණකගත කරන ලද අතර එම තොරතුරු ආශ්‍රයෙන් බැංකු සැසඳුම් වාර්තා හා අවසන් ගිණුම් ලිපි ගොනු යාවත්කාලීන කරන ලදී.

මේ වර්ෂයට අදාළ ව මාසික වැටුප් වාර්තා සකස් කිරම, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා ව්‍යවස්ථාපිත අඩු කිරම් සඳහා වාර මුදල් ගෙවීම් කටයුතුත්, අවකරණ ලේඛන සකස් කිරම, ණය ලේඛන යාවත්කාලීන කිරම, 2010 වසරේ අවසාන ගිණුම් වාර්තාවේ කෙටුම්පත පිළියෙල කිරම, අවශ්‍ය වැටුප් විස්තර, ඇප තැන්පතු හා අනෙකුත් තොරතුරු ලබා දීම, වැටුප් ප්‍රතිව්‍යුහගත කිරම සඳහා අවශ්‍ය ආකෘති, විභාග පරිපාටි හා අනෙකුත් වාර්තා කෙටුම් පත් සැකසීම, සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල 2010 අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරම යනා දී කටයුතු මේ යටතේ සිදු කරනු ලැබේ. මෙයට අමතර ව මණ්ඩලයීය අවශ්‍යතා සඳහා ලිපි ද්‍රව්‍ය සැපයීමත්, අලෙවිහල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම, පොත් බැඳුම්හල සඳහා අවශ්‍ය උපකරණ කට්ටල හා රසායනික ද්‍රව්‍ය සැපයීම, පරිගණක යන්ත්‍ර 20 ක්, පරිගණකයක් සහ Computer Server 01ක්, PC 3588 කැබ රථයට කැනපි එකක් සවි කිරීම සහ රිසෝග්‍රාෆ් යන්ත්‍රය සඳහා අවශ්‍ය මාස්ටර් රෝල්, තීන්ත ටියුබ්, UPS 20ක් හා LCD 40" රූපවාහිනී යන්ත්‍රයක් මිල දී ගැනීම යනා දී කටයුතු මෙම වසර තුළ ඉටු කළ කාර්යයන් වේ.

**සමාප්තිය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් 2011 වර්ෂයේ දී ද මෙරට පුස්තකාල පද්ධතියට හා පාඨක ප්‍රජාව වෙත සුවිශේෂ වූ කාර්යභාරයක් ඉටු කිරීමට ලැබීම සතුටට කරුණකි. ඒ අනුව ඉහත සඳහන් කරන ලද තොරතුරු විමසීමේ දී පෙනී යන කරුණක් නම් ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතියේ වර්ධනයට මෙන් ම පැවැත්මට පැවති ඉමහත් ප්‍රයෝජනවත් ව්‍යාපෘති කිහිපයක් මෙම වසර තුළ ක්‍රියාවට නැංවීමට අප ආයතනයට හැකි වී තිබීමයි. එමගින් මෙරට සියලු ජන කොටස්වල පුස්තකාල පරිහරණය පිළිබඳ ඔවුන්ගේ උනන්දුව වර්ධනය කරලීම සඳහා බෙහෙවින් ඉවහල් වූ අතර, ඒ අනුව පසුගිය වසරේ ක්‍රියාත්මක කරන ලද ජාතික ව්‍යාපෘති මගින් පාඨක පරපුර අතර කියවීම ප්‍රචලිත කිරීමත්, පුස්තකාල සේවා හා ප්‍රකාශන ක්ෂේත්‍රවල කටයුතු සඳහා පහසුකම් සැලසීමටත්, පුස්තකාල ක්ෂේත්‍රයේ විද්වතුන් හා දිස්ත්‍රික්ක මට්ටමින් පුස්තකාල හා නිලධාරීන් ඇගයීමට ලක් කිරීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට අවකාශ ලැබීම වැදගත් කරුණකි. ජාතික කියවීමේ මාසය සහ අනෙකුත් පුස්තකාල ක්ෂේත්‍රයේ වැදගත් දිනයන්හි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනුණ අතර යුධ විපත් සිදු වූ ප්‍රදේශයන්හි නැගෙනහිර හා, උතුරු පළාත්වල යුද්ධයෙන් විනාශ වූ පුස්තකාල යළි නගාසිටුවීම සඳහා තොරතුරු රැස්කිරීම වැනි කටයුතු කරන ලදි. මෙවැනි ව්‍යාපෘති මගින් පුස්තකාල පහසුකම් නගාසිටුවීම සඳහා ද ලබාදෙන ලද මූල්‍ය ම ය, ද්‍රව්‍ය ම ය හා උපදේශක සේවා මගින් සාර්ථක ප්‍රතිඵල අත්විඳින්නට ලැබිණ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කටයුතු 2011 වසර තුළ සැලැස්මට අනුව සාර්ථක ව ඉටු කරලීමට නො හැකි වූවා නම් ඒ අධ්‍යක්ෂ මණ්ඩලයක් නො මැතිවීම හේතුවෙනි. එහෙත් වසර අවසානයේ දී 2011.09.01දින සිට දෙසැම්බර් දක්වා ලැබුණ සහාය කෘතඥතා පූර්වක ව සිහිපත් කරන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය තුමාගෙන් ද, එම ලේකම් තුමාගෙන් සහ ගරු අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය තුමාගෙන් ද ලැබුණු සහාය පිළිබඳ ව අතිශයින් කෘතඥ වෙමි. එමෙන් ම විවිධ ගැටලු හා මූල්‍ය දුෂ්කරතා මධ්‍යයේ වුව ද ආයතනය මගින් 2011 වසර සඳහා සැලසුම් කළ ව්‍යාපෘති කිහිපයක් හෝ වර්ෂය අවසානයේ දී කාර්යක්ෂම ව ක්‍රියාවට නැන්වීම හා ඒවා උසස් අයුරින් පවත්වාගෙන යෑම සඳහා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ඇතුළු අනෙකුත් සියලු ම කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහාය මෙහි දී අගය කරන අතර මෙම වාර්තාව සකස් කිරීමේ දී අප හට සහාය වූ ක්‍රමෝපායන සැලැසුම් අංශයේ අංශ ප්‍රධාන විජය ප්‍රේමදර්ශන මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ද අවසාන වශයෙන් කෘතඥතාව පිරිනමන්නෙමු.

එන් එච් එම් චිත්‍රානන්ද
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

මහාචාර්ය සෝමරත්න බාලසූරිය
සභාපති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14
නිදහස් මාවත
කොළඹ 07.

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## ගිණුම් වාර්තාව - 2011

අධ්‍යාපන සේවා අමාත්‍යාංශය

(මෙම වාර්ෂික ගිණුම් වාර්තාව අනුමත වනවිට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අයත්ව තිබුණේ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයටයි.)

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වයන්

| වත්කම් | සටහන් | 2011.12.31<br>රු. ශත. | 2010.12.31<br>රු. ශත. |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 752.487.07 | 4,489,923.74 |
| ලැබිය යුතු දෑ | 2 | 16,406,939.31 | 16,745,121.93 |
| තොගය | 3 | 19,649,228.31 | 14,803,392.75 |
| කලින් ගෙවීම් | 4 | 702,825.44 | 392,275.05 |
| තැන්පතු | 5 | 392,464.29 | 380,424.63 |
| | | 37,903,944.42 | 36,811,138.10 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 6 | 26,914,841.92 | 19,012,555.78 |
| ඉඩම සහ ගොඩනැගිල්ල | 7 | 40,188,778.64 | 41,244,515.10 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 8 | 39,259,421.58 | 40,241,253.14 |
| | | 106,363,042.14 | 100,498,324.02 |
| වත්කම් එකතුව | | 144,266,986.56 | 137,309,462.12 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වියදම් | 9 | 1,034,212.14 | 1,033,003.67 |
| උපචිත වියදම් | 10 | 1,766,782.26 | 1,821,408.00 |
| සේවක ප්‍රතිලාභ | 11 | 158,166.32 | 153,707.05 |
| වෙනත් ජංගම වගකීම් | 12 | 839,597.85 | 902,026.44 |
| | | 3,798,758.57 | 3,916,170.01 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම් | | 24,329,668.83 | 18,334,585.00 |
| වගකීම් එකතුව | | 28,128,427.40 | 22,250,755.01 |
| ශුද්ධ වත්කම් | | 116,138,559.16 | 115,058,707.11 |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | |
| ප්‍රාග්ධන/ වෙනත් අනුග්‍රාහක ආධාර | 13 | 72,454.15 | 5,184,329.97 |
| සංචිත | 14 | 13,920,422.69 | 12,683,621.81 |
| සමුච්ත ආදායම්/වියදම් | 15 | 102,145,682.32 | 97,190,755.33 |
| ශුද්ධ වත්කම් එකතුව / හිමිකම් | | 116,138,559.16 | 115,058,707.11 |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරන ලදී.(ශ්‍රී.ල.රා.ගි.ප්‍ර.)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් කරනු ලැබේ.

| | |
|---|---|
| ........................................ | ........................................ |
| සභාපති | අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) |
| ජා.පු.හාප්‍ර.සේ.ම. | ජා.පු.හාප්‍ර.සේ.ම. |

# 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධන විස්තර

| | සටහන් | 2011.12.31 | 2010.12.31 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **ආදායම්** | | | |
| ශ්‍රවණාගාරය කුලියට දීමෙන් | | 1,137,450.00 | 925,050.00 |
| පුස්තකාල ලිපිද්‍රව්‍ය අලෙවියෙන් | | 1,277,733.90 | 1,334,360.35 |
| පොත් අලෙවියේ ලාභය | | 1,194,270.13 | 235,120.40 |
| අයකිරීම්, දඩ, දඩ පොළිය | 16 | 931,850.00 | 696,935.00 |
| පොලී ආදායම | 17 | 682,184.84 | 734,258.72 |
| ප්‍රකාශන බෙදා හැරීම | 18 | 285,525.75 | 306,812.72 |
| පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ආධාර | | 63,170,000.00 | 64,500,000.00 |
| වෙනත් ආදායම් | 19 | 1,076,325.92 | 2,643,129.37 |
| ආදායම් එකතුව | | 69,755,340.54 | 71,375,666.56 |
| **වියදම්** | | | |
| පුස්තකාල සේවා වියදම් | 20 | 7,448,668.46 | 6,953,185.73 |
| පරිපාලන හා ආයතනික වියදම් | 21 | 75,495,133.93 | 67,459,560.25 |
| මූල්‍ය පිරිවැය | 22 | 33,093.05 | 16,857.00 |
| වියදම් එකතුව | | 82,976,895.44 | 74,429,602.98 |
| කාලය සඳහා අතිරික්තය / (හිඟ වැය) | | (13,221,554.90) | (3,053,936.42) |
| **වෙනත් ආදායම්** | | | |
| අලෙවිහල හා ගබඩාව ඉවත් කිරීමේ පාඩුව | | (907,794.39) | - |
| අදාළ කාලය සඳහා ශුද්ධ අතිරික්තය/ (හිඟය) | | (14,129,349.29) | (3,053,936.42) |

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශනය

| | මණ්ඩලයීය අරමුදල | ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ආධාර |
|---|---|---|
| 2009.12.31 දිනට ශේෂය | 88,459.00 | 23,678.00 |
| පූර්ව වර්ෂ ගැලපීම් | (6,009.00) | - |
| 2009.12.31 දිනට ගලපන ලද ශේෂය | 82,450.00 | 23,678.00 |
| ශුද්ධ අතිරික්තය (හිඟය) | (3,054.00) | - |
| ප්‍රාග්ධන ආධාර | - | 6,800.00 |
| වර්ෂයට අදාළ ගැලපීම් | 17,795.00 | (17,795.00) |
| 2010.12.31 දිනට ශේෂය | 97,191.00 | 12,683.00 |
| පූර්ව වර්ෂ ගැලපීම් | 5,350.00 | 968.00 |
| 2010.12.31 දිනට ගලපන ලද ශේෂය | 102,541.00 | 13,651.00 |
| ශුද්ධ අතිරික්තය (හිඟය) | (14,129.00) | - |
| ප්‍රාග්ධන ආධාර | - | 14,003.00 |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම් | 13,734.00 | (13,734.00) |
| 2011.12.31 දිනට ශේෂය | 102,146.00 | 13,920.00 |

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

| | | 2011.12.31<br>රු. ශත. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු මගින් මූල්‍ය ප්‍රවාහය** | | |
| ශුද්ධ අතිරික්තය (හිඟය) | | (14,129,349.29) |
| ගැලපීම් | | |
| - ක්ෂය කිරීම් | 6,956,493.76 | |
| - පෙර වර්ෂයේ ගැලපීම් | 1,206,201.34 | |
| | 8,162,695.10 | |
| දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ පාඩුව | 907,794.39 | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 7,604,378.53 | |
| | | 16,674,868.02 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | 2,545,518.73 |
| (වැඩි වීම්)/ අඩු වීම් තොග | (4,845,835.56) | |
| (වැඩි කිරීම්)/ අඩු කිරීම් ලැබිය යුතු දෑ | 338,182.62 | |
| (වැඩි කිරීම්)/ අඩු කිරීම් පූර්ව ගෙවීම් | (310,550.39) | |
| (වැඩි කිරීම්)/ අඩු කිරීම් තැන්පතු | (12,039.66) | |
| වැඩි කිරීම්/ (අඩු කිරීම්) ගෙවිය යුතු වියදම් | 1,208.47 | |
| වැඩි කිරීම්/ (අඩු කිරීම්) උපචිත වියදම් | (54,625.74) | |
| වැඩි කිරීම්/ (අඩු කිරීම්) සේවක ප්‍රතිලාභ | 4,459.27 | |
| වැඩි කිරීම්/ (අඩු කිරීම්) වෙනත් ජංගම වගකීම් | (62,428.59) | |
| | | (4,941,629.58) |
| **මෙහෙයුම් කටයුතු තුළින් ජනිත වූ මුදල** | | (2,396,110.85) |
| විශ්‍රාම පාරිතෝෂික ගෙව්වා | | (1,609,994.70) |
| **මෙහෙයුම් කටයුතු මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | (4,006,105.55) |
| **ආයෝජන කටයුතු මගින් මූල්‍ය ප්‍රවාහ** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ආධාර | 8,403,000.00 | |
| වසර තුළ ආයෝජන | - | |
| දේපල පිරියත හා උපකරණ මිල දී ගැනීම් | (8,134,331.12) | |
| **ආයෝජන කටයුතු මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | 268,668.88 |
| **මූල්‍ය කටයුතු මගින් මූල්‍ය ප්‍රවාහ** | | |
| දිගුකාලීන ණය කරුවන්ට නැවත ගෙවීම් | - | |
| **මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ** | | - |
| ශුද්ධ අඩු වීම් / වැඩි වීම් මූල්‍ය හා මූල්‍ය සමාන දෑ | | (3,737,436.67) |
| වසර ආරම්භයේ දී බැංකුවේ ශේෂය | | 4,489,923.74 |
| **වසර අවසානයේ දී මූල්‍ය හා මූල්‍ය සමාන දෑ** | | 752,487.07 |
| බැංකුවේ මුදල් - 2011.12.31 | | 752,487.07 |

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතට අනුව පිහිටුවන ලද මෙම ආයතනය 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත බවට සංශෝධනය විය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ලෙස රටතුළ පුස්තකාල සේවා සංවර්ධනය කිරීම වෙනුවෙන් සැලසුම් සැකසීම හා ආධාර කිරීම, ජාතික පුස්තකාලය පවත්වාගෙන යාම, මහජන පුස්තකාල හා පාසැල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම වෙනුවෙන් උපදෙස් හා ආධාර කිරීම, කියවීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම, ග්‍රන්ථ සංවර්ධනය හා ප්‍රලේඛන කටයුතු සඳහා අනුග්‍රහ දීම ආදිය වේ.

### 01. පොදු

### 01-01 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

(අ) මූල්‍ය තත්ව වාර්තාව, මූල්‍ය කාර්යසාධන වාර්තාව, ස්කන්ධ ප්‍රාග්ධන වෙනස් වීම් වාර්තාව, මූල්‍ය ප්‍රවාහ විස්තරය හා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ මණ්ඩලය විසින් යොදාගෙන තිබූ ගිණුම් විස්තර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට ( ශ්‍රී.ල.රා..ගි.ප්‍ර.) අනුව සකස් කර තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවල පළමු ප්‍රමිත 4ට අනුව 2011 වසරේ මූල්‍ය විස්තර සකසා ඇත.

(ආ) ඓතිහාසික වටිනාකම් සම්මුතියට යටත් ව මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී උද්ධමනීය සාධක ගලපා නොමැත.

(ඈ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් සකස් කරන ලදී.

(ඉ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය පනතට අනුකූලව මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

(ඊ) මණ්ඩලයීය මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ සංකල්පයට අනුව පිළියෙල කර තිබේ.

### 01-02 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව අනුගමනය කරන ලද අතර අනුරූපිව පසුගිය වසරේ අගයන් හා අසම්පූර්ණතා අවශ්‍ය පරිදි නැවත සකස් කරමින් පවත්නා වසරට ඉදිරිපත් කරන ලදී.

### 01-03 නොවෙනස්ව ඉදිරිපත් කිරීම

2011 වසරට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා ඒකක වර්ග කිරීම කාලානුරූප ව වෙනස්කර සකස් කරන ලද්දේ (ශ්‍රී.ල.රා.ගි.ප්‍ර.03 ට) අනුව වඩාත් සුදුසු ඉදිරිපත් කිරීම සඳහායි

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
# 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැදගත්
# ගිණුම්කරණ ප්‍රතිපත්ති

**02. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම**

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත්තේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියට අනුව වර්ෂයක් තුළ දී හෝ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දින සිට වර්ෂයක් ඇතුළත දී මුදල් හෝ මුදල් හා සමාන දෑ බව පත්වන දෑ වේ.

**02-1 දේපළ, පිරියත හා උපකරණය සහ ක්ෂයවීම**

**02-1-1 දේපළ, පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ වටිනාකම පෙන්වා ඇත්තේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකළ අගයට ය. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ගණනය කර ඇත්තේ ඒවා මිල දී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ එම වත්කම් වර්තමාන තත්වයට ගැනීම සඳහා දරන ලද සියලු වියදම් ද ඇතුළත්වය.

සපයනු ලබන සේවා ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් වත්කම් අත්පත්කර ගැනීමේ, අළුත්වැඩියා කිරීමේ සහ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද ස්ථිර ස්වභාවයේ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී.

**02-1-2 ක්ෂයවීම**

**ස්ථාවර වත්කම් හීනවන ශේෂ ක්‍රමය අනුව පහත සඳහන් පරිදි ක්ෂය කිරීම් කර ඇත.**

| | |
|---|---|
| ගොඩනැගිල්ල | 02 1/2 % |
| බිතු සිතුවම් | 02 1/2% |
| උපකරණ | 10% |
| මෝටර් රථ | 10% |
| පුස්තකාල උපකරණ | 10% |
| ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ | 10% |
| පොත් තොගය - ජාතික පුස්තකාලය | 10% |
| පොත් තොගය - ජාතික විද්‍යා පුස්තකාලය | 10% |
| පොත් බැඳුම් උපකරණ | 10% |
| රූපණ ද්‍රව්‍ය හා විද්‍යුත් මූලාශ්‍ර | 10% |

ස්ථාවර වත්කම් ඒවා හී ඉතිරි සඵල ආයුකාලය පුරාවට ක්ෂයවීම් ගණනය කර තිබේ.

මිල දී ගත් හෝ අත්කර ගත් වර්ෂය සඳහා ක්ෂයවීම් වෙනුවෙන් වෙන් කිරීම් අය නොකරන ලද අතර අදාළ ස්ථාවර වත්කම් අපහරණය කළ වර්ෂය සඳහා සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීම සිදුකරන ලදී.

**02-2 තොග**

මිල දී ගැනීමේ වටිනාකම හෝ ශුද්ධ විකිණීමේ වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම අනුව තොග තක්සේරු කරන ලදී.

**02-3 ලැබීම්**

ලැබීම් ලෙස අය වේ යැයි අපේක්ෂිත දෑ වල වටිනාකම ලැබීම් යටතේ දක්වා ඇත.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

**3. වගකීම් සහ වෙන්කිරීම්**

3.1 මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක් ඇතුළත දී ඉල්ලූ විට ගෙවිය යුතු ගෙවීම්, ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ව වාර්තාවේ වර්ග කර තිබේ.

මූල්‍ය තත්ව වාර්තාවේ දින සිට වර්ෂයක කාලයක් ඉක්ම ගිය පසු ගෙවිය යුතු ගෙවීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගකර තිබේ.

මූල්‍ය විස්තරය පිළියෙල කරන දිනට හෙළිදරව් වූ සියලු වගකීම් ගිණුම්ගත කර තිබේ.

**3.2 විශ්‍රාමික ප්‍රතිලාභ**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති (ශ්‍රීලගිප්‍ර - 19 ) ට අනුව විශ්‍රාමික පාරිතෝෂික සඳහා වසරක කාලයක් සේවය සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා වෙන් කිරීම් කර ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුකූලව වසර 05 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා පමණක් විශ්‍රාමික පාරිතෝෂික ගෙවිය යුතු වේ. මෙම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

**මූල්‍ය කාර්යසාධන විස්තර**

**4-1 ආදායම්**

(අ) මණ්ඩලයේ ඉපැයීම් යටතේ ශ්‍රවණාගාර කුලී ආදායම, අලෙවිහලේ ආදායම, පොලී ආදායම සහ විවිධ ආදායම් වශයෙන් ඉදිරිපත් කර ඇත.

(ආ) සියලු ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබේ.

(ඇ) 2011 වසර සඳහා රජයේ ප්‍රදාන ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වශයෙන් ලැබී ඇත.

**4-2 ආදායම් හඳුනාගැනීම**

(අ) ඉහත මූල්‍ය පදනම මත ලද ආදායම් අදාළ වියදම් හා ගලපා ඇත.

(ආ) පොළී ආදායම කාල පදනම මත උපචිත කර තිබේ.

**4-3 වියදම්**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම්, උපචිත පදනම මත ආදායමට එරෙහිව ගැලපීමෙන් පසු වර්ෂයේ අතිරික්තය/හිඟය නිරූපණය කර තිබේ.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

**05. රජයේ ප්‍රදාන**

වර්ෂය පුරා ලද රාජ්‍ය ප්‍රදාන, ආදායම ලෙස හඳුනාගෙන තිබේ.

**06. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති 02 - මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමවේදය අනුගමනය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර තිබේ.

**07. මූල්‍ය තත්වයන් ඉදිරිපත් කරන දිනට පසුව සිදු වු සිදුවීම්**

මූල්‍ය තත්ව වාර්තා දිනට පසු සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අවශ්‍ය පරිදි සලකා බලා හෙළිදරව් කර තිබේ.

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## මූල්‍ය විස්තර සටහන්

| | 2011.12.31<br>රු. ශත. | 2010.12.31<br>රු. ශත. |
|---|---|---|
| **සටහන් 01 - මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ගි/අ 2323283 - ලංකා බැංකුව | 122,323.70 | 4,098,295.26 |
| ගි/අ 100113398963 - මහජන බැංකුව | 7,030.06 | 7,030.06 |
| ගි/අ 100163170315 - මහජන බැංකුව | 623,133.31 | 384,598.42 |
| | 752,487.07 | 4,489,923.74 |
| **සටහන 02 - ලැබිය යුතු දෑ** | | |
| වැටුප් අත්තිකාරම් | 43,284.52 | 43,284.52 |
| උත්සව අත්තිකාරම් | 158,630.16 | 154,630.16 |
| ආපදා ණය | 16,005,736.72 | 16,459,857.20 |
| විශේෂ අත්තිකාරම් | 4,250.00 | 2,500.00 |
| සුළු මුදල් අග්‍රිමය | 15,223.00 | 15,223.00 |
| විවිධ අත්තිකාරම් | 179,814.91 | 69,627.05 |
| | 16,406,939.31 | 16,745,121.93 |
| **සටහන 03 - තොග** | | |
| පොත් තොගය - ජාත්‍යන්තර පොත් හුවමාරු සේවය | 106,435.30 | 109,922.80 |
| පොත් තොගය - අලෙවිය සහ බෙදාහැරීම | 13,435,468.07 | 9,992,005.18 |
| පොත් තොගය - සම්භාව්‍ය පොත් | 1,795,995.50 | 1,795,995.50 |
| පුස්තකාල ලිපිද්‍රව්‍ය තොග | 865,852.13 | 825,352.13 |
| පුස්තකාල උපකරණ | 261,211.00 | 261,211.00 |
| ලිපිද්‍රව්‍ය තොග- කාර්යාල | 1,341,864.47 | 387,811.30 |
| ලිපිද්‍රව්‍ය තොග (අලෙවිහල) | 1,431,094.84 | 1,431,094.84 |
| නො නිමි තොග - බුත්සරණ | 411,307.00 | - |
| | 19,649,228.31 | 14,803,392.75 |
| **සටහන් 04 - පූර්ව ගෙවීම්** | | |
| අලුත්වැඩියා හා නඩත්තු - කාර්යාල උපකරණ | - | 6,782.00 |
| පුවත්පත් හා ප්‍රකාශන | - | 88,385.00 |
| දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර | 67,021.00 | 28,353.33 |
| රක්ෂණ හා බලපත්‍ර - මෝටර් රථ | 172,212.42 | 73,738.17 |
| රක්ෂණය - දේපළ | - | 186,601.00 |
| ජාත්‍යන්තර පුස්තකාල සාමාජිකත්ව ලබාගැනීම | 247,014.00 | - |
| සැපයීම් සහ ඉල්ලීම් - වෙනත් | 212,205.52 | 6,346.19 |
| විවිධ | 4,372.50 | 2,069.36 |
| | 702,825.44 | 392,275.05 |

## සටහන්

### සටහන් 05 -තැන්පතු

| | | |
|---|---|---|
| ඉන්ධන සඳහා තැන්පතු | 56,116.00 | 56,116.00 |
| වාහන අලුත්වැඩියා සඳහා තැන්පතු | 10,000.00 | 10,000.00 |
| සේවක ආරක්ෂක තැන්පතු (ජා.ඉ.බැ.) | 166,066.68 | 161,607.41 |
| පොත් හුවමාරු සේවය සඳහා තැන්පතු | 160,281.61 | 152,701.22 |
| | 392,464.29 | 380,424.63 |

### සටහන 06 - යටිතල පහසුකම්, දේපළ සහ උපකරණ

| | | | |
|---|---|---|---|
| පුස්තකාල උපකරණ | 6.I | 26,206.24 | 29,118.04 |
| ජනකලා මධ්‍යස්ථානය සඳහා උපකරණ | 6.II | 8,369.05 | 9,298.95 |
| පොත් බැඳුම් උපකරණ | 6.III | 388,247.20 | 410,502.45 |
| කාර්යාල ලී බඩු හා උපකරණ | 6.IV | 18,931,527.90 | 16,563,090.20 |
| මෝටර් රථ | 6.V | 7,560,491.53 | 2,000,546.14 |
| | | 26,914,841.92 | 19,012,555.78 |

### සටහන් 07 - ඉඩම හා ගොඩනැගිලි

| | | | |
|---|---|---|---|
| ජාතික පුස්තකාල ගොඩනැගිල්ල | 7.I | 39,599,215.50 | 39,708,763.79 |
| ගබඩාව සහ අලෙවිහල | 7.II | - | 931,071.17 |
| මණ්ඩලයීය බිතුසිතුවම් | 7.III | 589,563.14 | 604,680.14 |
| | | 40,188,778.64 | 41,244,515.10 |

### සටහන් 08 - වෙනත් මූල්‍ය නොවන වත්කම්

| | | | |
|---|---|---|---|
| පොත් තොගය ජාතික පුස්තකාලය | 8.I | 36,226,742.57 | 39,845,424.80 |
| පොත් තොගය - ජාතික විද්‍යා පුස්තකාලය | 8.II | 356,245.51 | 395,828.34 |
| සූක්ෂම චිත්‍රපට හා විද්‍යුත් මූලාශ්‍ර | 8.III | 2,676,433.50 | - |
| | | 39,259,421.58 | 40,241,253.14 |

### සටහන් 09 - ගෙවිය යුතු දෑ

| | | |
|---|---|---|
| ටෙන්ඩර් තැන්පතු | 230,270.20 | 246,282.20 |
| ආරක්ෂක තැන්පතු - වෙනත් | 34,725.00 | 34,725.00 |
| ආරක්ෂක තැන්පතු - පොත් හුවමාරු සේවය | 13,725.00 | 13,725.00 |
| රඳවා ගත් මුදල් | 88,640.29 | 64,057.49 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 64,270.00 | 63,795.00 |
| ගෙවිය යුතු බදු | 86,175.68 | 75,412.18 |
| කර්තෘ ප්‍රකාශන ණයහිමියෝ | 490,555.97 | 509,156.80 |
| කලින් ලද සාමාජික ගාස්තු | 25,850.00 | 25,850.00 |
| | 1,034,212.14 | 1,033,003.67 |

**සටහන් 10 - උපචිත වියදම්**

| | | |
|---|---|---|
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 35,289.71 | 20,400.14 |
| සංග්‍රහ වියදම් | 1,675.00 | 2,292.00 |
| සේවක ගමන් වියදම් - (දේශීය) | 9,045.50 | 434.00 |
| තොරතුරු තාක්ෂණ පොලී | - | 35,640.57 |
| අලුත්වැඩියා හා ගොඩනැගිලි නඩත්තුව | 49,795.20 | 79,184.00 |
| දුරකථන | 91,291.65 | 71,921.70 |
| විදුලිය | 417,008.00 | - |
| දැන්වීම් ගාස්තු | - | 16,765.30 |
| ආරක්ෂක වියදම් | - | 102,547.15 |
| විගණන ගාස්තු | 1,000,240.00 | 800,240.00 |
| මුද්දර ගාස්තු | - | 475.00 |
| ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ වියදම් | - | 224,730.00 |
| අත්පිටපත් සමීක්ෂණ ගාස්තු | - | 59,441.60 |
| පුස්තකාල සාහිත්‍ය හා ප්‍රකාශන වියදම් | - | 45,687.50 |
| නව ප්‍රකාශන මිල දී ගැනීමේ වියදම් | - | 267,961.09 |
| ශිෂ්‍යත්ව හා පුහුණු වියදම් | - | 42,534.40 |
| මුද්‍රණ වියදම් | - | 6,324.00 |
| පුවත්පත් හා ප්‍රචාරක වියදම් | - | 8,320.00 |
| වෙනත් දීමනා | 78,600.00 | - |
| තැපැල් ගාස්තු | 31,219.20 | - |
| ටෙන්ඩර් තැන්පතු | 15,000.00 | - |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 21,523.00 | - |
| ලිබඩු අමතර කොටස් හා කාර්යාල උපකරණ | 9,500.00 | - |
| වෙනත් උපචිත වියදම් | 6,595.00 | 42,534.40 |
| | 1,766,782.26 | 1,827,432.85 |

**සටහන් අංක 11 - සේවක ප්‍රතිලාභ**

| | | |
|---|---|---|
| සේවක ආරක්ෂක තැන්පතු | 68,200.00 | 71,200.00 |
| ආරක්ෂක තැන්පතු පොළිය | 89,966.32 | 82,507.05 |
| | 158,166.32 | 153,707.05 |

**සටහන - 12 වෙනත් ජංගම වගකීම්**

| | | |
|---|---|---|
| වෙනත් ආයතනවලින් ආපසු අයකර ගැනීමට ඇති වියදම් | 839,597.85 | 902,026.44 |
| | 839,597.85 | 902,026.44 |

**සටහන් 13 - ප්‍රාග්ධන /වෙනත් ආයතනවලින් ලද ප්‍රදාන**

| | | |
|---|---|---|
| ප්‍රදාන හා පරිත්‍යාග හිඟුම (පුස්තකාල ද්‍රව්‍ය) | 5,184,329.97 | 5,184,329.97 |
| ශේෂය ඉ/ගෙ | (5,111,875.82) | - |
| පූර්ව කාලයේ දෝෂ | 72,454.15 | 5,184,329.97 |

**සටහන් - 14 සංචිත**

ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන

| | | |
|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 12,683,621.81 | 23,678,820.95 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | 968,132.00 | |
| | 13,651,753.81 | |
| එකතු කළා භාණ්ඩාගාරයේ ලැබීම් | 14,003,000.00 | 6,800,000.00 |
| | 27,654,753.81 | 30,478,820.95 |
| අඩු කළා ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම් | (13,734,331.12) | (17,795,199.14) |
| | 13,920,422.69 | 12,683,621.81 |

**සටහන් 15 - ඒකාබද්ධ අරමුදල**

| | | |
|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 97,190,755.33 | 88,458,793.30 |
| පූර්ව කාලයේ ගැලපීම් | 5,349,945.16 | (6,009,300.69) |
| | 102,540,700.49 | 82,449,492.61 |
| එකතු කිරීම් / අඩු කිරීම් | | |
| වියදම ඉක්ම වූ ආදායම් | (14,129,349.29) | (3,053,936.42) |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම් | 13,734,331.12 | 17,795,199.14 |
| | 102,145,682.32 | 97,190,755.33 |

**සටහන් 16 - අය කිරීම්, දඩ හා අයභාර**

| | | |
|---|---|---|
| අත්පිටපත් සමීක්ෂණයට ලද ගාස්තු | 149,244.00 | 800.00 |
| සාමාජිකත්වය ගැනීමෙන් ලද ගාස්තු | 294,337.00 | 285,985.00 |
| කුලියට දීමෙන් ලද ගාස්තු | 6,360.00 | 6,905.00 |
| අයි. එස්. බී.එන් අයදුම්පත් ගාස්තු | 433,919.00 | 380,895.00 |
| දඩ හා අයභාර | 47,990.00 | 22,350.00 |
| | 931,850.00 | 696,935.00 |

**සටහන් 17 - පොළී ආදායම**

| | | |
|---|---|---|
| ආපදා ණය | 666,884.07 | 719,419.77 |
| විශේෂ අත්තිකාරම් | 7,720.38 | 7,196.76 |
| වෙනත් පොළී | 7,580.39 | 7,642.19 |
| | 682,184.84 | 734,258.72 |

**සටහන් 18 - ප්‍රකාශන බෙදාහැරීම**

| | | |
|---|---|---|
| ග්‍රන්ථ නාමාවලී අලෙවිය | 141,760.00 | 89,202.50 |
| මණ්ඩලයීය ප්‍රකාශන අලෙවිය | 143,765.75 | 217,610.22 |
| | 285,525.75 | 306,812.72 |

**සටහන් 19 - වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| ඡායා පිටපත් ගාස්තු | 110,538.39 | 96,769.09 |
| ටෙන්ඩර් අයදුම්පත් අලෙවිය | 27,000.00 | 16,750.00 |
| ඉන්ධන සඳහා ලැබීම් | - | 7,057.00 |
| ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අයදුම්පත් ගාස්තු | 42,350.00 | 15,290.00 |
| බැඳුම් ද්‍රව්‍ය අලෙවිය | (39,037.00) | 30,532.00 |
| අබලිද්‍රව්‍ය අලෙවිය | 163,544.50 | 4,200.00 |
| පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ ලැබීම් | 62,550.00 | 50,250.00 |
| උපදේශක ගාස්තු | - | 2,600.00 |
| විවිධ ආදායම් | 709,380.03 | 2,419,681.28 |
| | 1,076,325.92 | 2,643,129.37 |

**සටහන් අංක 20 - පුස්තකාල සේවා වියදම්**

| | | | |
|---|---|---|---|
| සාමාජික ගාස්තු - අන්තර්ජාතික පුස්තකාල | | 284,698.00 | 411,859.00 |
| අන්තර්ජාතික හුවමාරු සේවය | | 5,400.00 | 24,876.20 |
| ප්‍රතිග්‍රහණ වියදම් | | 58,765.00 | 122,231.15 |
| පාඨක අධ්‍යාපන හා ප්‍රචාරක වියදම් | | 218,797.88 | 23,278.00 |
| පුස්තකාල පර්යේෂණ වියදම් | | 63,358.50 | 17,100.00 |
| කාර්යාල ලිපිද්‍රව්‍ය වියදම් | | 21,102.00 | 59,314.58 |
| ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම | | 69,480.00 | 198,195.98 |
| පූර්ව කාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය පළ කිරීම | | - | 8,077.04 |
| විශේෂ ග්‍රන්ථ නාමාවලි පළ කිරීම | | 4,635.00 | 8,490.00 |
| සමාජ විද්‍යා ප්‍රලේඛන | | 53,979.00 | 26,237.86 |
| පුවත්පත් අනුක්‍රමණිකාව | | 16,475.00 | - |
| වෙනත් ප්‍රලේඛන කටයුතු | | 101,382.00 | 60,495.00 |
| පුස්තකාල වැඩසටහන් හා ප්‍රදර්ශන | | 103,740.76 | 49,010.16 |
| පුස්තකාලවලට පොත් පරිත්‍යාග කිරීම | | 504,988.00 | 2,675,275.00 |
| පුස්තකාලවලට උපකරණ පරිත්‍යාග කිරීම | | - | 3,850.00 |
| ජාතික කියවීමේ මාසයේ වියදම් | | 705,038.78 | 1,017,781.92 |
| ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය | | 287,234.00 | 186,485.00 |
| පරිගණක කටයුතු සඳහා වියදම් | | 27,474.72 | 198,600.80 |
| අන්තර්ජාල වියදම් | | 482,527.55 | 482,621.11 |
| පුස්තකාල අධ්‍යාපන සම්මන්ත්‍රණ | | 253,973.00 | 136,540.00 |
| සම්මන්ත්‍රණ දේශන හා පුහුණු | | 373,109.00 | 193,627.60 |
| විශේෂ පුහුණු පාඨමාලා | | 147,962.32 | 44,537.60 |
| ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ වියදම් | | 70,084.00 | 43,182.06 |
| අත්පිටපත් සමීක්ෂණ ගාස්තු | | 79,749.30 | 3,659.70 |
| සම්භාව්‍ය කෘති සංස්කරණය හා ප්‍රකාශනය | | 700.00 | 115,392.00 |
| පුස්තකාල සාහිත්‍ය හා ප්‍රකාශන වියදම් | | 28,675.00 | 167,662.00 |
| අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක | | 89,433.00 | - |
| අන්තර්ජාතික ප්‍රමිති මාලික අංක | | 79,023.00 | - |
| අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක | | 33,103.00 | 15,350.00 |
| නව ප්‍රකාශන මිල දී ගැනීම | | 616,320.32 | 6,056.00 |
| පොත් ප්‍රතිෂ්ඨාපනය | | 233,682.36 | 273,058.21 |
| පොත් බැඳීම් | | 340,689.97 | 316, 752.74 |
| සංරක්ෂණ වියදම් | | 93,088.00 | 63,589.02 |
| | | 7,448,668.46 | 6,953,185.73 |
| **සටහන් 21 - පරිපාලන හා ආයතනික වියදම්** | | | |
| සේවක වැටුප් හා සේවක දීමනා | 21-1 | 53,552,520.42 | 45,693,136.81 |
| සැපයීම් හා පාරිභෝගික ද්‍රව්‍ය | 21-2 | 10,053,112.98 | 9,848,906.73 |
| අලුත්වැඩියා හා නඩත්තු - ප්‍රාග්ධන වත්කම් | 21-3 | 4,134,729.87 | 4,614,238.23 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 21-4 | 6,956,493.76 | 6,538,176.13 |
| වෙනත් වියදම් | 21-5 | 798,276.90 | 765,102.35 |
| | | 75,495,133.93 | 67,459,560.25 |
| **සටහන් 22 - මූල්‍ය පිරිවැය** | | | |
| බැංකු ගාස්තු | | 33,093.05 | 16,857.00 |
| | | 33,093.05 | 16,857.00 |

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## මූල්‍ය විස්තර පිළිබඳ සටහන්

## සටහන් 06,07,08

### 2011 දෙසැම්බර් 31 දිනට පිරියත,දේපළ හා උපකරණ

| සටහන් | විස්තරය | ක්ෂයවීම් අගය | 2011.01.01 දිනට වටිනාකම | එකතු කිරීම් | ඉවත් කිරීම් | මුළු පිරිවැය | 2011.01.01 දිනට සමුච්චිත ක්ෂය | එකතු කිරීම් / ඉවත් කිරීම් | ක්ෂය 2011 වසර සඳහා | මුළු ක්ෂය | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6.I | පුස්තකාල උපකරණ | 10% | 96,512.16 | - | - | 96,512.16 | 67,394.12 | - | 2,911.80 | 70,305.92 | 26,206.24 |
| 6.II | ජනකලා මධ්‍යස්ථානයේ උපකරණ | 10% | 46,874.00 | - | - | 46,874.00 | 37,575.05 | - | 929.90 | 38,504.95 | 8,369.06 |
| 6.III | පොත් බැඳුම් උපකරණ | 10% | 1,526,750.44 | 18,795.00 | - | 1,545,545.44 | 1,116,247.99 | - | 41,050.25 | 1,157,298.24 | 388,247.21 |
| 6.IV | කාර්යාල උපකරණ | 10% | 39,161,981.07 | 4,087,746.72 | (63,000.00) | 43,186,727.79 | 22,598,890.87 | - | 1,656,309.02 | 24,255,199.89 | 18,931,527.90 |
| 6.V | මෝටර් රථ | 10% | 7,658,374.74 | 5,795,600.00 | (735,000.00) | 12,718,974.74 | 5,657,828.60 | (699,400.00) | 200,054.61 | 5,158,483.21 | 7,560,491.53 |
| 7.I | ජාතික පුස්තකාල ගොඩනැගිල්ල | 2.50% | 63,888,022.00 | 883,170.80 | - | 64,771,192.80 | 24,179,258.21 | - | 992,719.09 | 25,171,977.30 | 39,599,215.50 |
| 7.II | අලෙවිහල හා ගබඩා ගොඩනැගිල්ල | 2.50% | 1,361,174.00 | - | (1,361,174.00) | - | 430,102.83 | (453"379.61) | 23,276.78 | (0.00) | 00 |
| 7.III | මණ්ඩලයීය බිතුසිතුවම | 2.50% | 890,610.25 | | - | 890,610.25 | 285,930.11 | - | 15,117.00 | 301,047.11 | 589,563.14 |
| 8.I | ජාතික පුස්තකාල පොත් තොගය | 10% | 82,003,344.95 | 3,085,911.75 | (3,310,926.00) | 81,778,330.70 | 42,157,920.15 | (293,493.00) | 3,687,160.98 | 45,551,588.13 | 36,226,742.57 |
| 8.II | ජාතික විද්‍යා පුස්තකාලයේ පොත් තොගය | 10% | 2,431,276.00 | - | - | 2,431,276.00 | 2,035,447.66 | - | 39,582.83 | 2,075,030.49 | 356,245.51 |
| 8.III | සූක්ෂම චිත්‍රපට හා විද්‍යුත් මූලාශ්‍ර | 10% | - | 3,267,308.00 | - | 3,267,308.00 | - | 293,493.00 | 297,381.50 | 590,874.50 | 2,676,433.50 |
| | එකතුව | | 199,064,919.61 | 17,138,532.27 | (5,470,100.00) | 210,733,351.88 | 98,566,595.59 | (1,152,779.61) | 6,956,493.77 | 104,370,309.75 | 106,363,042.13 |

**සටහන් 21-1 වැටුප් වේතන හා සහ සේවක දීමනා**

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 37,195,704.23 | 38,001,440.23 |
| සේ. අ. අ. | 4,348,493.01 | 4,506,025.07 |
| සේ. භා. අ. | 1,087,130.99 | 1,126,077.87 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 1,615,481.77 | 835,364.39 |
| පාරිතෝෂික | 7,604,378.53 | - |
| මණ්ඩලයීය සාමාජික පාරිශ්‍රමික | 77,200.00 | 22,000.00 |
| කමිටු සාමාජික පාරිශ්‍රමික | 120,200.00 | 57,100.00 |
| ශ්‍රවණාගාරයේ වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම් | 65,050.00 | 42,175.00 |
| ගමන් වියදම් | 230,176.50 | 126,511.50 |
| විදේශ ගමන් හා අධ්‍යාපනික වැඩසටහන් | 378,475.13 | 85,392.50 |
| සේවක නිල ඇඳුම් | 18,935.43 | 98,393.44 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 10,520.00 | 30,597.50 |
| සුබසාධක වියදම් | 245,160.50 | 223,751.81 |
| සංග්‍රහ වියදම් | 111,223.00 | 59,317.50 |
| සහනදායි දුම්රිය ප්‍රවේශ පත්‍ර | 411,499.33 | 452,740.00 |
| තරඟ විභාග ගාස්තු | 32,892.00 | 26,250.00 |
| | 53,552,520.42 | 45,693,136.81 |

**සටහන් 21-2 සැපයීම් හා පරිභෝජන වියදම්**

| | | |
|---|---|---|
| ලිපිද්‍රව්‍ය හා මුද්‍රිත ආකෘති පත්‍ර | - | 878,594.48 |
| දේපළ රක්ෂණ | 239,987.83 | 367,791.73 |
| වාහන රක්ෂණ | 286,099.68 | 141,694.57 |
| ඉන්ධන | 1,044,694.50 | 710,111.00 |
| දුරකථන | 987,331.28 | 1,000,281.27 |
| විදුලිය | 4,921,681.62 | 4,606,305.60 |
| ආරක්ෂක වියදම් | 1,681,612.35 | 1,163,308.81 |
| ප්‍රවාහන, ප්‍රමාද හා ගුදම් ගාස්තු | 20,571.00 | 113,179.00 |
| මුද්‍රණ වියදම් | 13,925.40 | 29,216.00 |
| පුවත්පත් හා ප්‍රකාශන | 107,955.00 | 138,557.95 |
| තැපැල් ගාස්තු | 383,719.20 | 276,895.00 |
| පරිවර්තන ගාස්තු | 50,047.00 | 17,240.88 |
| වෙනත් සැපයීම් | 315,488.12 | 405,730.44 |
| | 10,053,112.98 | 9,848,906.73 |

**සටහන් 21-3 අලුත්වැඩියා හා නඩත්තු - ප්‍රාග්ධන වත්කම්**

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල නඩත්තුව | 1,947,342.80 | 2,184,105.51 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 550,742.57 | 668,439.22 |
| මණ්ඩලයීය භූමිය නඩත්තුව | 506,553.48 | 674,135.50 |
| මෝටර් රථ නඩත්තුව | 1,130,091.02 | 1,087,558.00 |
| | 4,134,729.87 | 4,614,238.23 |

**සටහන් 21-4 ක්ෂය හා ක්‍රමක්ෂය**

| | | |
|---|---|---|
| වර්ෂයේ ක්ෂයවීම් | 6,956,493.76 | 6,538,176.13 |
| | 6,956,493.76 | 6,538,176.13 |

**සටහන් 21-5 වෙනත් වියදම්**

| | | |
|---|---|---|
| විගණන ගාස්තු | 200,000.00 | 400,000.00 |
| නීති ගාස්තු | - | 20,825.00 |
| දැන්වීම් වියදම් | 470,152.46 | 296,369.35 |
| විවිධ වියදම් | 128,124.44 | 47,908.00 |
| | 798,276.90 | 765,102.35 |

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 මැයි 19 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

වත්කමක ප්‍රයෝජනවත් ආයුකාලය අනුව ක්ෂයවීම් තීරණය කළ යුතු නමුත් ඊ පිළිබඳ නොසලකා පරිගණක හා උපාංග, පුස්තකාල පොත්, සුක්ෂම සේයාපටල හා විද්‍යුත් මූලාශ්‍ර හීනවන ශේෂ ක්‍රමයට සියයට 10 බැගින් ක්ෂය කර තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුස්තකාල ලිපිද්‍රව්‍ය , පුස්තකාල උපකරණ හා පොත් අලෙවියෙන් ලද මුදල් ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණද අදාල පිරිවැය ආදායමට එරෙහිව ලියාහැරීමට කටයුතු නොකිරීම නිසා මේ වනවිට මණ්ඩලයේ භෞතිකව නොපවතින තොගයක් ගිණුම්වලින් නිරූපණය කරන ලදි. මෙසේ අලෙවි කළ පුස්තකාල ලිපිද්‍රව්‍ය හා උපකරණවල වටිනාකම රු.1,995,006 ක් ලෙස හඳුනාගෙන තිබුණද කොමිස් ආදායම් ලබාගැනීමේ පදනම මත අලෙවිකරනු ලබන කතෘ ප්‍රකාශන ව්‍යාපෘතියේ ලැබීම් හා ගෙවීම් පොත් අලෙවි ආදායම් ගිණුමට සටහන් කිරීම නිසා පොත් අලෙවි ආදායම හඳුනාගැනීමට නොහැකි විය.

(ආ) මණ්ඩලය විසින් පුස්තකාල ලිපිද්‍රව්‍ය හා මාණ්ඩලීය ප්‍රකාශන නිෂ්පාදනය කරන අතර ඒ සඳහා යොදාගත් පරිග්‍රහන කඩදාසි මිලදී ගැනීම සඳහා දරන ලද සම්පූර්ණ පිරිවැය රු.553,000 ක් අදාළ අලෙවි ආදායමෙන් හිලව් කර ගිණුම් වල දක්වා තිබූ අතර වර්ෂය අවසානයේ ඉතිරි තොග ගණනය කර ඒ සඳහා ගැළපීම් සිදුකර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන් වෙත පරිත්‍යාග කළ රු.268,992 ක් වූ පුස්තකාල සංරක්ෂණ හා බැඳුම් ද්‍රව්‍ය සම්පූර්ණයෙන් ගිණුම්වලින් අත්හැරී තිබුණි. වර්ෂය තුළ මිලදී ගත් රු.128,900 ක් වූ එම ද්‍රව්‍ය පිරිවැයට රු.89,863 ක් වූ අලෙවි ආදායම හිලව් කිරීමෙන් ඇතිවූ රු.39,037 ක හර ශේෂය විවිධ ආදායමට හිලව් කර තිබුණි. එසේම තොග ගිණුම් පවත්වා නොගැනීම නිසා වර්ෂය අවසානයේ ඉතිරි තොගය වූ රු.59,342 ක් ගිණුම්ගත කර, නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් තොගයේ ඇතුළත් එකතුව රු.1,692,302 ක් වූ "ලිපිද්‍රව්‍ය" සහ "පුස්තකාල උපකරණ තොගය" වසර කිහිපයක සිට ගිණුම් වල දක්වා තිබුණද භෞතිකව නොපැවතුණි.

(ඉ) 2011 දෙසැම්බර් 31 දිනට සම්භාව්‍ය කෘති ලෙජර් ගිණුමේ ශේෂය රු.1,795,995 ක් වූ නමුත් ගබඩාවේ සත්‍ය ශේෂය රු.6,995 ක් විය. ඒ අනුව වර්ෂය අවසාන තොගයෙහි පැවති රු.1,789,000ක වෙනස හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ රු.159,404 කට අබලි භාණ්ඩ ලෙස අලෙවි කළ ස්ථාවර වත්කම් වල පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගිණුම් වල ගැලපීම් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී අලෙවි කරන ලද මෝටර් රථයක රු.635,710 ක් වූ සමුච්චිත ක්ෂය වත්කම් ඉවත් කිරීමේ ගිණුමට රු.735,000 ක් ලෙස ගලපා තිබුණි.

(ඌ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 12 වගන්තිය අනුව ජාතික ලේඛනාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් (නීතිමය තැන්පතු) සහ වෙනත් පරිත්‍යාග ලෙස මණ්ඩලයට ලැබෙන පොත් වටිනාකම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුළ කඩා ඉවත්කල මණ්ඩලීය පොත් අලෙවිහලෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම් වලින් ඉවත් කිරීම වෙනුවට ගබඩා ගොඩනැගිල්ලේ හා පොත්හල් ගොඩනැගිල්ලේ මුළු පිරිවැය වන රු.1,361,174 ක් හා මුළු සමුච්චිත ක්ෂය වන රු.453,380 ක් අදාළ ගිණුම් වලින් ඉවත් කර තිබුණි. එසේම කඩා ඉවත්කල ආරක්ෂක කුටිය, තාප්පය හා යකඩ වැටෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය අදාල ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඒ) මිලදී ගැනීම් අදාළ තොග ගිණුම්වලට හර කිරීම වෙනුවට, සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් පුස්තකාල පරිත්‍යාග කට්ටල සඳහා වූ ද්‍රව්‍ය සහ කාර්යාල ලිපි ද්‍රව්‍ය රු.94,275 ක් "පුස්තකාල ලිපි ද්‍රව්‍ය අලෙවි ආදායම්" ගිණුමටද රු.28,750 ක් "පුස්තකාල උපකරණ අලෙවි ආදායම්" ගිණුමටද හර කර තිබුණි.

(ඔ) මණ්ඩලයේ විවිධ වැඩසටහන් සඳහා අනුග්‍රහ භවතුන්ගෙන් ලැබුණු මුදල් ඒ ඒ වර්ෂයේ ආදායමට බැර කිරීම වෙනුවට "බාහිර ආයතන වලින් ප්‍රතිපූර්ණය කළ යුතු වියදම්" නමින් ගිණුමකට බැරකර 2011 දෙසැම්බර් 31 දිනට රු.839,598 ක් වූ ශේෂය ජංගම බැරකම් යටතේ නිරූපණය කර තිබූ නමුත් ඒ සඳහා නිශ්චිතව හඳුනාගත් බැරකමක්ද නොවීය.

## 2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

-------------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් අදාල ලේඛන හා උපලේඛන සමඟ සැසඳීමේදී එකතුව රු.11,136,477ක වෙනසක් විය.

## 2.2.4 විගණන සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.72,454 ක් වූ ප්‍රදාන හා ආධාර ගිණුමේ ශේෂය සහ එකතුව රු.1,034,212 ක් වූ තැන්පතු හා ගෙවිය යුතු ශේෂ අටක් සඳහා ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

## 2.2.5 ගෙවිය යුතු ගිණුම්

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.86,175 ක් වූ බදු, දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු බදු ගිණුමක සටහන් කර තිබුණි.

(ආ) විගණන ගාස්තු වාර්ෂිකව නියමිත පරිදි ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු විගණන ගාස්තු ගිණුමේ ශේෂය රු.800,240 ක් වී තිබුණි.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත | |
| (i) 3 වන වගන්තිය | 2010 මැයි 10 දින ඉල්ලා අස් වූ සාමාජික මණ්ඩලය නැවත පත්කිරීමට වසරකුත් මාස 04 ක කාලයක් ප්‍රමාද කර තිබුණි. |
| (ii) 13 වගන්තිය | මණ්ඩලයේ ලේකම් හා ප්‍රධාන විධායක නිලධාරි වූ අධ්‍යක්ෂක ජනරාල් තනතුර 2010 ජූනි 01 දින සිට 2014 මාර්තු 31 දක්වාම වැඩ බැලීමේ පදනම මත පවත්වා ගෙන ගොස් තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 756 | මණ්ඩල පොත් අලෙවිහලෙහි ඉතිරි තොග භෞතිකව සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 සහ 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ | ස්ථාවර වත්කම් ලේඛනය, ස්ථාවර වත්කම් ලෙජරය සහ පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ලේඛන පවත්වා නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් සිදුවී ඇති මූල්‍ය ප්‍රතිඵලය රු.14,129,349 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව, ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,053,936 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලය රු.11,075,413 කින් පිරිහී තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව සමස්ථ ආදායම රු.1,620,326 කින් අඩු වී තිබියදී මණ්ඩලයේ වියදම රු.8,547,292 කින් වැඩිවීම සහ නගර අලංකරන කටයුතු සඳහා කඩා දමන ලද මණ්ඩලයේ ගොඩනැගිලිවල රු.907,794 ක් වූ ශුද්ධ අගය ආදායම් හා වියදම් ගිණුමට ගැලපීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3.2 අරමුදල් උපයෝජනය

2011 දෙසැම්බර් 31 දිනට රු.13,920,423 ක් වූ වැය නොකල රජයේ ප්‍රාග්ධන ආධාර ගිණුමේ ශේෂය මුදලින් හෝ ආයෝජනවලින් නිරූපනය විය යුතු වුවත් 2011 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.122,324 ක් පමණක් විය. මේ අනුව ඒ ඒ වර්ෂවල ලැබෙන ප්‍රාග්ධන ආධාර පුනරාවර්තන වියදම් සඳහා යොදාගෙන ඇති බවත් රාජ්‍ය ප්‍රදාන උපයෝජනය සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය ප්‍රමාණවත් නොවන බවත් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ අංශ 08 ක් යටතේ සැලසුම්කර තිබූ කාර්යයන් 50 ක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලීය ප්‍රකාශන

1998 සිට 2009 කාලය තුළ මුද්‍රිත ජාතික ග්‍රන්ථ නාමාවලියේ (ප්‍රවර්තන) 2011 දෙසැම්බර් 31 දිනට භෞතික තොගය, තොග ලේඛන සමඟ සැසඳීමේදී පිටපත් 4,851 ක ඌනතාවයක් පැවතුණි. 2008 වර්ෂයේ කටයුතු නිමකිරීමට සැලසුම් කරන ලද "කතෘ නාම සාධිකාරී ලේඛනයේ (දෙමළ)" කටයුතුද අවසන්වී නොතිබුණි.

(ආ) ජාතික පුවත්පත් සූක්ෂම සේයාපටල මිලදී ගැනීමේ ව්‍යාපෘතිය

ජාතික පුවත්පත් සූක්ෂම සේයාපටල අත්පත් කර ගැනීම අඛන්ඩව හා ක්‍රමානුකූල ආකාරයට සිදුනොවීම මත 1990 සිට 2011 වර්ෂ අතර කාලය තුළ අත්පත් කරගත් සේයාපටල සංඛ්‍යාව 1,217 ක් පමණක් වූ අතර ඒවා භෞතික සමීක්ෂණයකට ලක් නොකිරීම, ඒ සඳහා විස්තරාත්මක ලේඛනයක් සහ වෙනම ලෙජර් ගිණුමක් නොපැවැත්වීම, සූක්ෂම සේයාපටල මුද්‍රණ යන්ත්‍රය වසර 10 කටත් අධික කාලයක සිට අක්‍රියව පැවතීම යන කරුණු හේතුවෙන් ඒවා අත්පත් කරගැනීම, නඩත්තුව හා පරිහරණය අසතුටුදායක තත්ත්වයේ පැවතුණි.

(ඇ) ජාත්‍යන්තර පොත් හුවමාරු වැඩසටහන

ජාත්‍යන්තර පොත් හුවමාරු වැඩසටහන සඳහා පොත් මිලදී ගැනීමේ නිර්නායකයන් හඳුනා නොගැනීම හා පොත් තේරීම් කමිටුවක් පත් නොකිරීම, පෙර වර්ෂයන්හි ජාත්‍යන්තර ආයතන විසින් ප්‍රතික්ෂේපිත පොත් ඇතුළත් ලැයිස්තු නැවත නැවතත් එම ආයතන වෙත ඉදිරිපත් කිරීම, ආදී කරුණු හේතුවෙන් 2011 වර්ෂයේ ජාත්‍යන්තර ආයතන 12 ක් වෙත ඉදිරිපත් කරන ලද වර්ග 76 ක පොත් පිටපත් 912 කින් කිසිදු පොතක් ඉල්ලුම් කර නොතිබූ අතර මෙම වැඩසටහන යටතේ විවිධ භාෂාවලින් ලැබුණු පොත් 551 ක් සහ සිඩී (CD) 02 ක් සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරයද පැහැදිලි නොවීය.

(ඈ) පොත් ප්‍රදර්ශන පැවැත්වීම

1995 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 4 වගන්තිය අනුව කියවීමේ පුරුද්ද වැඩිදියුණු කිරීම සඳහා ප්‍රදර්ශන පැවැත්වීම මණ්ඩලයට අයත් කාර්යයක් වුවද, ඒ සඳහා පූර්ව සැලසුම්, අයවැය වාර්තා හා වියදම් වාර්තා සකස් කර නොතිබූ අතර පොත් ප්‍රදර්ශන වියදම් අරපිරිමැසුම්දායී නොවීමත්, පොත් අලෙවි ආදායම් අප්‍රමාදව මණ්ඩල අරමුදලට බැර නොකිරීමත් යන කරුණුද නිරීක්ෂණය විය.

(ඉ) නව ප්‍රකාශන මිලදී ගැනීමේ ව්‍යාපෘතිය

නව ප්‍රකාශන මිලදී ගැනීමේ කමිටුව විසින් පොත්වල ගුණාත්මකභාවය හා වටිනාකම සැලකිල්ලට ගනිමින් පොත් වර්ග 108 කින් රු.808,500 ක් වටිනා පිටපත් 3,565 ක් පමණක් මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණද එයට පටහැනිව පොත් වර්ග 113 කින් රු.1,800,186 ක් වටිනා පිටපත් 7,911 ක් මිලදී ගෙන තිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ 197 ක් වූ මුළු අනුමත සේවක සංඛ්‍යාවෙන් 74 ක් පුරප්පාඩු වී පැවතුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර දෙකක ප්‍රමාදයකින් පසු 2014 පෙබරවාරි 28 දින ඉදිරිපත් කර තිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඒ ඒ කාර්යයන් ඉටු කරන ලද කාල පරාසය ,එක් එක් කාර්ය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන හා කාර්ය ප්‍රමාණයන් දක්වා නොතිබීම හේතුවෙන් එය සංයුක්ත සැලැස්ම හා අයවැය ලේඛණ සමඟ සමගාමී නොවූ අතර කාලානුරූපිව සමාලෝචනය කර යාවත්කාලීනකර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳිය හැකි ආකාරයට කාර්යසාධන වාර්තා සකස් කර නොතිබූ අතර ඒවා සාමාජික මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදීම අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

## 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 ඡේදය අනුව අයවැය ලේඛනය සමඟ අයවැයගත ආදායම් ප්‍රකාශනය, ශේෂපත්‍රය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අයවැය ලේඛනය හා සත්‍ය ආදායම් වියදම් අතර සියයට 27 සිට සියයට 36 ක් අතර පරාසයක් තුළ සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2012 මැයි 22 දිනැති පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නියෝග කර තිබූ නමුත් ඉටු නොකළ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(අ) එක් නිලධාරියෙකු සහිතව අකාර්යක්ෂමව පවතින අභ්‍යන්තර විගණන අංශය සඳහා මාසයක් ඇතුළත තවත් නිලධාරීන් තුන්දෙනෙක් පත්කිරීම.

(ආ) වත්කම් සමීක්ෂණයක් පවත්වා හැකි ඉක්මනින් ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම.

(ඇ) වැය නොකළ රජයේ ප්‍රාග්ධන ආධාර මුදලින් හෝ වෙනත් ආයෝජනයක් ලෙස නොපැවතීම නිවැරදි කර වාර්තා කිරීම.

(ඈ) 2006 සැප්තැම්බර් 30 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය උල්ලංඝනය කරමින් රු.38,530 ක් වූ ආරම්භක වැටුපට වඩා වැටුප් පියවර 10 ක් ඉදිරියෙන් තබා මාසයකට රු.48,430 ක් වශයෙන් හිටපු කළමනාකාර අධ්‍යක්ෂවරයාට වැටුප් ගෙවීම නිසා වැඩිපුර ගෙවූ රු.247,500 ක මුදල නැවත ඔහුගෙන් අයකර ගැනීම.

(ඉ) රු.887,906 ක වියදමකින් පුස්තකාල  ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ සැලසුම් සකස් කරනු ලැබුවද ඒවා ක්‍රියාත්මක නොකිරීම අවධානයට ලක්කර 2013 වර්ෂයේදී අයවැය ප්‍රතිපාදන වෙන්කර ගෙන පුස්තකාල  ගොඩනැගිල්ල නැවත සැලසුම් කිරීම.

## 06. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුව ඇත.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) තොග පාලනය
(ඉ) අත්තිකාරම් පාලනය
(ඊ) පොත් ප්‍රදර්ශන හා අලෙවිය
(උ) මණ්ඩලීය ප්‍රකාශන මුද්‍රණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)